සංස්කෘත භාෂාව

संस्कृतभाषा

04

හතරවැනි ශ්‍රේණිය

මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ප්‍රථම මුද්‍රණය - 2017
දෙවැනි මුද්‍රණය - 2019

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0453-2

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
හොරණ, මිදෙල්ලමුලහේන, තල්ගහවිල පාර, අංක 65c හි පිහිටි
සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

- ආනන්ද සමරකෝන්

ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ පණිවුඩය

පිරිවෙන් මඟින් ගිහි පැවිදි දෙපක්ෂයට ම භාෂා, ආගමික හා සාරධර්ම අධ්‍යාපනය ලබා දීම චිරාත් කාලයක සිට පැවත ආ බැවින්, පිරිවෙන යනු ශ්‍රී ලාංකික අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය බවට පත් විය. එය දේශීය ගිහි පැවිදි ශිෂ්‍ය පරම්පරාව පමණක් නොව විදේශීය විද්‍යාර්ථීන් ද ඥානනය කළ විශ්වවිද්‍යාලයක් බඳු ස්ථානයක් විය. එක් එක් යුගයේ අවශ්‍යතා අනුව සකස් වූ විෂයමාලාවක් පිරිවෙන් අධ්‍යාපනය මඟින් සිසුන් වෙත ප්‍රදානය කරනු ලැබිණි. එබැවින් ම එවැනි අධ්‍යාපන මධ්‍යස්ථාන විශ්ව සම්භාවනාවට පත් විය.

විදේශීය ආක්‍රමණ හමුවේ - විශේෂයෙන් ම පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ආක්‍රමණ හමුවේ - පිරිවෙන් අධ්‍යාපනය ගුණාත්මක වශයෙන් හීන වී ගිය බව සැබෑ ය.

එහෙත් 1753 දී ශ්‍රී ලංකාවේ මහණ උපසම්පදාව යළි පිහිටුවීමට ක්‍රියාකළ අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමිපාණන්ගේ කැපවීම මත පිරිවෙන නැමැති අධ්‍යාපන ආයතනය ශීඝ්‍ර දියුණුවකට පත් ව දෙස් විදෙස් කීර්තියට පත්වීම අප ලැබූ ජයග්‍රහණයකි.

අනෙකුත් අධ්‍යාපන ක්ෂේත්‍රවලට මෙන් ම පිරිවෙන් අධ්‍යාපනයට ද නිදහස් අධ්‍යාපන සංකල්පය වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම අර්ථවත් කිරීම අපගේ පරම අපේක්ෂාවයි. පිරිවෙන් පෙළපොත් නොමිලයේ සැපයීමෙන් රජය ඉහළ වැයක් දරුව ද එමගින් සමස්ත ජනතාවගේ විනය, සදාචාරය හා යහපැවැත්ම පිරිවෙන් ශිෂ්‍ය ප්‍රජාව වෙතින් ඉටු වනු ඇතැයි උදක් ම අපේක්ෂා ඇති ව මෙම පොත ඔබ අතට පත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකන අතර මෙම පොත පරිහරණය කිරීමෙන් ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නැණ ගුණ දියුණු වේවායි ද පතමි.

අකිල විරාජ් කාරියවසම්
අධ්‍යාපන අමාත්‍ය

පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ පණිවුඩය

සම්භාව්‍ය අධ්‍යාපනයේ සුවිශේෂී සලකුණ පිරිවෙන් අධ්‍යාපනයයි. ථෙරවාදී සම්ප්‍රදාය කේන්ද්‍ර කරගත් විෂයමාලාව, පුළුල් විෂය ක්ෂේත්‍ර කරා ව්‍යාප්තව ඇත. ලාංකේය සමාජීය අවශ්‍යතා ඉටුකරනු වස් පිරිවෙන් අධ්‍යාපනය ද නව මාන ඔස්සේ සමාජය ආකර්ෂණය කරගෙන සිටියි. පිරිවෙන් අධ්‍යාපනය මඟින් ඉටු කළ යුත්තේ සමාජ අවශ්‍යතා ය. සමාජ අවශ්‍යතා වෙනස් වන විට පිරිවෙන ද, විෂයමාලාව ද, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම හා ඇගයීම් ඇතුළු පිරිවෙනේ සමස්ත ක්‍රියාවලිය ද අනන්‍යතාව සුරැකෙන අයුරින් වෙනස් විය යුතු ය. එය සමාජයට සම්ප්‍රේෂණය විය යුතු ය. පිරිවෙන් අධ්‍යාපනයෙහි ශාසනික සම්ප්‍රදායන් රැකගනිමින් සසුනේ චිරස්ථිතිය සඳහා ඇවැසි පදනම ගොඩනැගිය යුතු ය.

වර්තමාන ගෝලීය ප්‍රවණතා හමුවේ හුදකලා වූ තැනක පිරිවෙන තිබිය යුතු නැත. විශ්වීය පුරවැසියකු නිර්මාණය කිරීමේ කාර්යයෙන් බැහැරවීමට පිරිවෙන් අධ්‍යාපනයට ද නොහැකි ය. එසේ විය යුතු ද නැත. සම්භාව්‍ය අධ්‍යාපන සම්ප්‍රදාය රැකගනිමින්, පිරිවෙන් අධ්‍යාපනය යාවත්කාලීන කිරීම උදෙසා නව ඉගෙනුම් ක්‍රියාකාරකම්, ක්‍රම ශිල්ප හා තාක්ෂණික ක්‍රමවේද උපයෝගී කරගත යුතු අතර ඒවායින් බැහැර වීම සිදු නොවිය යුතු ය.

නිපුණතා පාදක විෂයමාලා ප්‍රතිසංස්කරණය අනුව මෙම පෙළ පොත ද සම්පාදනය කර ඇත. පිරිපුන් සමාජයක් ගොඩනැගීම සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමවේද මඟින් නූතන ලෝකයේ ශීඝ්‍ර ලෙස ප්‍රසාරණය වන දැනුම යාවත්කාලීන කිරීමට උනන්දු විය යුතු ය. හුදෙක් ම අධ්‍යාපනය යනු ආර්ථික සංවර්ධනය සඳහා ම සීමා වූවක් නොවේ. එය දැනුම් ආර්ථිකයක් පදනම් කරගත් සංකල්ප ඔස්සේ ගමන් කරන ආධ්‍යාත්මික සංවර්ධනයෙන් සතුටු වන පුරවැසියකු නිර්මාණය කිරීමට ද ඉවහල් කොට ගත යුතු ය.

ශිෂ්‍ය මිතුරු ඉගෙනුම් ක්‍රියාවලිය අනුව සකස් කර ඇති මෙම පෙළ පොත ඔබට මාර්ගෝපදේශයකි. එය යළි භාවිත කළ හැකි අයුරින් පරිශීලනය කිරීම ඔබගේ යුතුකමක් මෙන් ම වගකීමකි.

විජිත වෙලගෙදර
අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
අධ්‍යාපන අමාත්‍යාංශය

පෙරවදන

ශ්‍රී ලංකාවේ සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා බුද්ධිමත් ගුණවත් භික්ෂු භික්ෂුණී පරපුරක් මෙන් ම ධර්මානුධර්ම පටිපන්න උවසු උවැසියන් පිරිසක් ද සිටිය යුතු ය. ඒ සඳහා මැනවින් අධ්‍යාපනය ලබා ශික්ෂණය විය යුතු ය. ශික්ෂිත පුරවැසියා ලෝකයට සම්පතකි. පිරිවෙන් අධ්‍යාපනයෙන් ලබන දැනුම පමණක් නොව භාවනා ක්‍රම පුහුණු වීම ආදියෙන් ලබන මානසික සංවර්ධනය, මිනිස් ජීවිතයේ ලැබිය හැකි ලෞකික හා ලෝකෝත්තර සියලු පුරුෂාර්ථ සාධනය කිරීමෙහිලා පිටිවහලකි.

ත්‍රිවිධ ශාසනයේ ගැඹුර හා එහි අනෙක්විධ විටිනාකම් පිළිබඳ ලබන අවබෝධය අතිශය වැදගත් වේ. අප හමුවේ ඇති අනාගත අභියෝග සාර්ථකව ජයග්‍රහණය කරනු වස් ඒ සඳහා අවැසි දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරගත යුතු ය. ලෝකයේ විශිෂ්ටතම දාර්ශනික වූත් ඓතිහාසික වූත් ජීවන රටාවක හිමිකම අපට ඇත. පිරිපුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙන් අධ්‍යාපනයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාර්යක්ෂමව ඵලදායී අයුරින් කටයුතු කළ යුතු ය. විශ්වීය පුරවැසියකු ලෙස ඔබගේ උත්සාහය, කැපවීම හා අධිෂ්ඨානශීලීව කටයුතු කිරීම, තිරසර සංවර්ධනයට ද රුකුලකි.

මෙම පොත සම්පාදනය කිරීම සඳහා කටයුතු කළ ලේඛක හා සංස්කාරක මණ්ඩලයේ සියලු දෙනාටත් පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාව හිමිවේ.

ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය, බත්තරමුල්ල.
2019.04.10

නියාමනය හා අධීක්ෂණය :-

ඩබ්ලිව්. එම්. ජයන්ත වික්‍රමනායක	-	අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

මෙහෙයවීම :-

විජිත වෙලගෙදර	-	අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) අධ්‍යාපන අමාත්‍යාංශය
ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි	-	අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

උපදේශකත්වය :-

පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි	-	මහාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය

සම්බන්ධීකරණය :-

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි	-	සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත) අධ්‍යාපන අමාත්‍යාංශය
ඩී.එම්.ජේ. පුෂ්පකුමාර	-	නියෝජ්‍ය කොමසාරිස් (පාලන) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ප්‍රදීප් ඉඳුනිල් පියරත්න	-	සහකාර කොමසාරිස් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සංස්කරණය :-

කේ.බී. ජයවර්ධන	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

ලේඛක මණ්ඩලය :-

පූජ්‍ය උඩවෙල රේවත හිමි (සභාපති)	-	කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි	-	සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත) අධ්‍යාපන අමාත්‍යාංශය
පූජ්‍ය රූපහ ඤාණරතන හිමි	-	පරිවේණාචාර්ය ගම්/ශාසනවර්ධන මූලික පිරිවෙණ මීරිගම
පූජ්‍ය මල්අස්නේ තිලකවංශ හිමි	-	පරිවේණාචාර්ය ගම්/ශ්‍රී සුමංගල මහ පිරිවෙණ වලලියද්ද, එල්ලක්කල

ඩී.ජී. සුනිල්	-	පරිවේණාචාර්ය ගා/ශ්‍රී විජයානන්ද පිරිවෙණ හබරකඩ
පූජ්‍ය බෝදාවල පියභාරතී හිමි (ගරු සහභාගීත්වය)	-	පරිවේණාචාර්ය විද්‍යාලංකාර පිරිවෙණ පෑලියගොඩ
පූජ්‍ය බණ්ඩාරවෙල සාරද හිමි (ගරු සහභාගීත්වය)	-	පරිවේණාධිපති ගම්/විද්‍යාශේඛර මහ පිරිවෙණ බැණ්ඩියමුල්ල, ගම්පහ
පූජ්‍ය අබේසේකරගම විජිත හිමි (ගරු සහභාගීත්වය)	-	පරිවේණාධිපති ගා/ශ්‍රී රේවත විද්‍යායතන පිරිවෙණ කුඹල්වැල්ල, ගාල්ල
ඩබ්ලිව්. ලසන්ත කුමාර (ගරු සහභාගීත්වය)	-	පරිවේණාචාර්ය ගම්/පද්මාවතී මහ පිරිවෙණ කෑරගල, හේනේගම

සෝදුපත් කියැවීම :-

කේ.බී. ජයවර්ධන	-	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය

පිටු නිර්මාණය සහ පිට කවරය :-

ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ	-	පරිගණක අංශය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

පරිගණකගත කිරීම :-

පූජ්‍ය උඩවෙල රේවත හිමි	-	කථිකාචාර්ය සංස්කෘත අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි	-	සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සංස්කෘත) අධ්‍යාපන අමාත්‍යාංශය
පූජ්‍ය නෙල්ලිවල සිරිනන්ද හිමි	-	පරිවේණාචාර්ය ගම්/ශ්‍රී සුදර්ශන ධර්මායතන මූලික පිරිවෙණ තිඹිරිගම, කිරිඳිවැල
ක්‍රිෂ්නි සමුද්ධිකා නවරත්නගේ	-	පරිගණක අංශය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

विषयानुक्रमणिका ।

01. अक्षरं मित्रम्।	(अक्षर प्रभेदाः।)	01
02. समागमः सापगमः।	(अक्षर परिचयः।)	11
03. धर्मात् प्रभवते सुखम् ।	(नाम परिचयः। १ - स्वरान्त।)	19
04. अपि सर्वं कुशलम्।	(नाम परिचयः। २ - हलन्त।)	30
05. अस्ति कश्चिद्वाग्विशेषः ?	(आख्यात परिचयः। १ - लट् / लङ्)	37
06. चिन्ता मास्तु।	(आख्यात परिचयः। २ - लोट् / विधिलिङ्)	51
07. वर्धनाद्रक्षणं श्रेयः।	(सन्धि परिचयः। १)	63
08. सर्वमुत्पादि भङ्गुरम्।	(सन्धि परिचयः। २)	70
09. जगतः पितरौ वन्दे।	(समास परिचयः। १)	73
10. त्यज दुर्जनसंसर्गः।	(समास परिचयः। २)	79
11. कीदृशी वाग्विदग्धता ?	(तद्धित परिचयः। १)	84
12. किं त्वं वाचालोऽसि ?	(तद्धित परिचयः। २)	92

13. सम्भाषणं कर्तुं शक्नोषि किल ? (कृदन्त परिचयः। १) 99

14. अवश्यं लभते कर्ता फलं पापस्य कर्मणः। (कृदन्त परिचयः। २) 110

15. कथं कदा कुत्र गच्छति ? (वाक्य निर्माण परिचयः। १) 118

16. किमर्थं किञ्चिन्न पठसि ? (वाक्य निर्माण परिचयः। २) 132

17. वाक्यं रसात्मकं काव्यम्। (साहित्य परिचयः। १) 138

18. अव्यापारे व्यापारं मा कुरु। (साहित्य परिचयः। २) 140

01
පාඩම
प्रथमः पाठः।

अक्षरं मित्रम्।

(අක්ෂර මිතුරෙකි.)

अक्षर प्रभेदाः।

මානවයා සතු ප්‍රබලතම සන්නිවේදන මාධ්‍යය වනුයේ භාෂාව යි. භාෂාවක් යනු, ශබ්ද සමූහයකි. මෙම ශබ්ද සංවිධිත ස්වභාවයකට මුවින් පිටවන විට කථා ව්‍යවහාරය හෙවත් භාෂණය බිහි වේ. භාෂණය වන ශබ්ද ලේඛන ගත කිරීම සඳහා භාවිත කෙරෙන සංකේත සමූහය **අක්ෂර** යනුවෙන් හැඳින්වේ. සංස්කෘත භාෂාව ලේඛන ගත කිරීම සඳහා භාවිත කෙරෙන්නේ දේවනාගරී අක්ෂරමාලාව යි.

स्वर - १४

अ	आ	इ	ई	उ	ऊ	ऋ	ॠ	ऌ	ॡ
ए	ऐ	ओ	औ						

व्यञ्जन - ३५

क्	ख्	ग्	घ्	ङ्
च्	छ्	ज्	झ्	ञ्
ट्	ठ्	ड्	ढ्	ण्
त्	थ्	द्	ध्	न्
प्	फ्	ब्	भ्	म्
य्	व्	र्	ल्	
श्	ष्	स	ह्	
अं	अ(ः)			

ස්වර ප්‍රභේද

ස්වර යනු පණකුරු හෙවත් ප්‍රාණාක්ෂර යි. ස්වරාක්ෂර තනි ව උච්චාරණය කළ හැකි ය.


स्वरप्रभेदाः
ह्रस्व
दीर्घ
प्लुत
सन्ध्यक्षर
नामिन्
अनामिन्
समान
गुण
वृद्धि

හ්‍රස්ව	එක් මාත්‍රාවක් (කෙටි කාලයක්) තුළ උච්චාරණය කළ හැකි අකුරු හ්‍රස්ව නම් වේ. ඒවා 05 කි.	एकमात्रो भवेद्ध्रस्वो द्विमात्रो दीर्घ उच्यते । त्रिमात्रस्तु प्लुतो ज्ञेयो व्यञ्जनञ्चार्धमात्रकम् ॥
	अ इ उ ऋ ऌ	
දීර්ඝ	මාත්‍රා දෙකක පමණ කාලයක් තුළ උච්චාරණය වන අකුරු දීර්ඝ නම් වේ. ඒවා 09 කි.	
	आ ई ऊ ॠ ॡ ए ऐ ओ औ	
ප්ලුත	ප්ලුත ලියා පෙන්වීමට නොහැකි ය. මාත්‍රා දෙකකට වඩා වැඩි කාලයක් තුළ උච්චාරණය වන අකුරු ය. දුර සිටින අයෙකුට අඬ ගැසීමේ දී, ගායනයේ දී, හැඬීමේ දී හා විචාරයේ දී භාවිත වේ.	
සන්ධ්‍යක්ෂර	අක්ෂර දෙකක එකතුවෙන් සකස් වන අකුරු සන්ධ්‍යක්ෂර නමින් හැඳින්වේ.	ए ऐ ओ औ सन्ध्यक्षराणि ।
	अ + इ = ए अ + ए = ऐ अ + उ = ओ अ + ओ = औ *अवर्ण + इवर्ण = ए* *अकार + एकार = ऐ* *अवर्ण + उवर्ण = ओ* *अकार + ओकार = औ*	
නාමින්	ස්වර අක්ෂරමාලාවේ अ,आ දෙක හැර අනෙක් සියලු ම ස්වර නැමෙන සුලු බැවින් නාමින් ලෙස හඳුන්වයි.	अवर्जा नामिनः ।
	इ > य् उ > व् ऋ > र् ऌ > ल्	
අනාමින්	ස්වර අක්ෂරමාලාවේ अ,आ අනාමින් වේ.	
සමානාක්ෂර	अ इ उ ऋ ऌ යන අකුරු පහ සමානාක්ෂර වේ.	अ इ उ ऋ ऌ समानाः ।

ගුණ	ए ओ अर् अल् යන අක්ෂර හතර ගුණ නම් වේ.	अरेदो नामिनो गुणाः।
වෘද්ධි	आ ऐ औ आर् आल् යන අක්ෂර පහ වෘද්ධි නමින් හැඳින්වේ.	आरै औ वृद्धिः।

व्यञ्जनप्रभेदाः



वर्गाक्षर	ව්‍යඤ්ජනාක්ෂරවල **क** සිට **म** දක්වා අකුරු විසි පහ **වර්ගාක්ෂර** හෙවත් **ස්පර්ශාක්ෂර** යනුවෙන් හැඳින්වේ. क ख ग घ ङ च छ ज झ ञ ट ठ ड ढ ण त थ द ध न प फ ब भ म [कादयो मावसानाः स्पर्शाः / कुचुटुतुपुवर्गाः]
अन्तःस्थ	ව්‍යඤ්ජන ස්වභාවයත් ස්වර ස්වභාවයත් ඇති බැවින් මෙම අකුරු **අන්තඃස්ථ** යනුවෙන් හැඳින්වේ. य व र ल [यरलवा अन्तःस्थाः]
ऊष्मन्	ශබ්ද කරන විට උණුසුම් වායු ධාරාවක් පිටවන බැවින් මෙම අක්ෂර **ඌෂ්මාක්ෂර** නමින් හැඳින්වේ. श ष स ह [शषसहा ऊष्माणः]
अनुस्वार	බින්දුව **අනුස්වාරය** නමින් හැඳින්වේ. अं [वर्णशिरो बिन्दुरनुस्वारः]
विसर्ग	උඩ යට සිටින සේ ලියනු ලබන බින්දු දෙක **විසර්ගය** නම් වේ. මෙම අකුර ශබ්ද කරන විට මුවින් වායුව විශේෂයෙන් පිටවෙයි. अः [अः इति विसर्जनीयः]
घोष	මෙම අක්ෂරයන් උච්චාරණය කරන විට මහත් වූ ශබ්දයක් සහිත ව හඬ පිට වන බැවින් **ඝෝෂාක්ෂර** නමින් හැඳින්වේ. ස්වර අක්ෂර සියල්ල ද ඝෝෂාක්ෂර නම් වේ. මේවා සියල්ල ගණනින් 34කි. अ आ इ ई उ ऊ ऋ ॠ ऌ ॡ ए ऐ ओ औ ग घ ङ ज झ ञ ड ढ ण द ध न ब भ म य व र ल ह
अनुनासिक / वर्गान्त	වර්ගයන්ගේ අවසාන අකුරු පහ **අනුනාසික** හා **වර්ගාන්ත** නමින් හැඳින්වේ. ङ ञ ण न म [मुखनासिकाभ्यामुच्चार्यमानो वर्णानुनासिकः]
अघोष	මෙම අක්ෂරයන් උච්චාරණය කරන විට අඩු ශබ්දයක් සහිත ව හඬ පිට වන බැවින් **අඝෝෂාක්ෂර** නමින් හැඳින්වේ. මේවා ගණනින් 13කි. क ख च छ ट ठ त थ प फ श ष स

अल्पप्राण	අඩු ප්‍රාණයකින් හඬ හා වායු ධාරාව පිට කිරීමෙන් උච්චාරණය කරනු ලබන අක්ෂර අල්පප්‍රාණ නම් වේ. क ग च ज ट ड त द प ब
महाप्राण	වැඩි ප්‍රාණයකින් හඬ හා වායු ධාරාව පිටවීමෙන් උච්චාරණය වන අක්ෂර මහාප්‍රාණ නම් වේ. ख घ छ झ ठ ढ थ ध फ भ

නාගරී ඉලක්කම්

1 → १   2 → २

3 → ३   4 → ४

5 → ५   6 → ६

7 → ७   8 → ८

9 → ९   0 → ०

අභ්‍යාසය 1.1

1. පහත සංඛ්‍යා නාගරී ඉලක්කමෙන් ලියන්න.

   1. 1815   2. 1818   3. 1848   4. 1948   5. 1972

2. පහත නාගරී සංඛ්‍යා සාමාන්‍ය ඉලක්කමෙන් ලියන්න.

   1. १९५६   2. २६००   3. १५०५   4. १९८५   5. १६१ – १३७

ක්‍රියාකාරකම 1.1

1. පහත දක්වා ඇති අක්ෂරවලින් අල්පප්‍රාණ අක්ෂර හා මහාප්‍රාණ අක්ෂර තෝරා ඉදිරියෙන් ඇති පොතෙහි නියමිත පිටුවල ලියන්න.





02. සංස්කෘත ස්වර අක්ෂරමාලාව අධ්‍යයනයෙන් පහත දක්වා ඇති අක්ෂර නියමිත ස්ථානවල යොදන්න.



අභ්‍යාසය 1.2

01. ඔබ ඉගෙන ගත් සංස්කෘත ස්වර අක්ෂරමාලාව ආශ්‍රයෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

ස්වර						
හ්‍රස්ව	දීර්ඝ	ගුණ	වෘද්ධි	අනාමින්	සන්ධ්‍යක්ෂර	සමාන

02. පහත දක්වා ඇති ව්‍යඤ්ජන අක්ෂර ඔබ ඉගෙනගත් පරිදි ප්‍රභේදවලට වෙන් කරන්න.

क ख ग
घ ङ च छ ज
झ ञ ट ठ ड ढ ण त थ द
ध न प फ ब भ म य व र ल
श ष स ह
अं अः

වර්ගාක්ෂර	අන්තඃස්ථ	ඌෂ්මන්	අනුස්වාරය	විසර්ගය	ඝෝෂ	අඝෝෂ	අනුනාසික

03. පහත සඳහන් සූත්‍රවලට ගැළපෙන අක්ෂර ඉදිරියෙන් ලියන්න.

ए ऐ ओ औ सन्ध्यक्षराणि	
अवर्जा नामिनः	
कुचुटुतुपुवर्गाः	
अ इ उ ऋ ऌ समानाः	
यरलवा अन्तःस्थाः	
शषसहा ऊष्माणः	
वर्णशिरो बिन्दुरनुस्वारः	
अः इति विसर्जनीयः	
मुखनासिकाभ्यामुच्चार्यमानो वर्णानुनासिकः	

वर्णमालागीतम् ।

कमलं विकसति सुन्दरसरसि
क ख ग घ ङ ॥
चटकः गायति चिव् चिव् गीतम्
च छ ज झ ञ ॥
टण् टण् नादं करोति घण्टा
ट ठ ड ढ ण ॥
तरुवर शाखाः हरिताः हरिताः
त थ द ध न ॥
पश्यत पश्यत - लघु लघु मत्स्यान्
प फ ब भ म ॥
यत्र तत्र रे चित्रपतङ्गाः
य र ल व ॥
शशकशावको धावति कूजति
श ष स ह ॥
पठन्तु सर्वे - वदन्तु सर्वे
क च ट त प ॥
क ख ग घ ङ - च छ ज झ ञ
ट ठ ड ढ ण - त थ द ध न
प फ ब भ म
य र ल व - श ष स ह
पठन्तु सर्वे - वदन्तु सर्वे
क च ट त प
कण्टे कण्टे सदैव भवतु वर्णानां माला ।
मालां धृत्वा गायामः रे लल् लल् लल् ला ॥

අන්තර්ජාලයෙන් මෙම ගීතය ශ්‍රවණය කළ හැකි ය.
https://youtu.be/qS12VRHWXM1

अङ्गारः शतधौतेन मलिनत्वं न मुञ्चति ।
අඞ්ගාරඃ ශතධෞතේන මලිනත්වං න මුඤ්චති
සියවරක් සේදුවත් අඟුරු සුදු නොවේ.

अर्धो घटो घोषमुपैति नूनम् ।
අර්ධෝ ඝටෝ ඝෝෂමුපෛති නූනම්
නොපිරුණු කළය නිතර හඬ නගයි.

02
පාඩම
प्रथमः पाठः।

समागमः सापगमः।

(එක්වීම වෙන්වීම)

अक्षर परिचयः।

අප ඉගෙනගත් සංස්කෘත අක්ෂරමාලාව සිංහල හා පාලි භාෂා ඉගෙනීම සඳහා බෙහෙවින් ම උපකාරී වේ. අප භාවිත කරන මිශ්‍ර සිංහල හෝඩිය, පාලි හා සංස්කෘත භාෂාවල අක්ෂර එකතුවෙන් උපන් හෝඩිය ලෙස හැඳින්විය හැකි ය. පාලි අක්ෂරමාලාවෙහි හා සංස්කෘත අක්ෂරමාලාවෙහි භාවිත අක්ෂරවලින් ස්වර හයක් ද ව්‍යඤ්ජන දහසයක් ද අමිශ්‍ර සිංහල හෝඩියට එකතු කිරීමෙන් මිශ්‍ර සිංහල හෝඩිය සකසාගෙන ඇත. පාලි හෝඩියේ අක්ෂර හතළිස් එකක් ද නූතන සිංහල හෝඩියේ අක්ෂර හැටක් ද ඇති බව සැලකිය යුතු ය.

සිංහල, සංස්කෘත, පාලි භාෂාවල ස්වර අකුරු සංසන්දනය

සිංහල ස්වර 18	සිංහල ශබ්දය හා රූපය	අ	ආ	ඇ	ඈ	ඉ	ඊ	උ	ඌ	ඍ	ඎ	ඏ	ඐ	එ	ඒ	ඓ	ඔ	ඕ	ඖ
සංස්කෘත ස්වර 14	සංස්කෘත ශබ්දය	අ	ආ	-	-	ඉ	ඊ	උ	ඌ	ඍ	ඎ	ඏ	ඐ	-	ඒ	ඓ	-	ඕ	ඖ
	දේවනාගරී රූපය	अ	आ	-	-	इ	ई	उ	ऊ	ऋ	ॠ	ऌ	ॡ	-	ए	ऐ	-	ओ	औ
පාලි 08	පාලි ශබ්දය හා රූපය	අ	ආ	-	-	ඉ	ඊ	උ	ඌ	-	-	-	-	එ	-	-	ඔ	-	-

- සිංහල භාෂාවේ ඇති ඇ, ඈ, එ, ඔ යන ස්වර සංස්කෘත භාෂාවේ ඇතුළත් නොවේ.
- සිංහල භාෂාවේ ඇති ඇ, ඈ, ඍ, ඎ, ඏ, ඐ, ඓ, ඖ යන ස්වර පාලි භාෂාවේ ඇතුළත් නොවේ.

සිංහල, සංස්කෘත, පාලි භාෂාවල ව්‍යඤ්ජන අකුරු සංසන්දනය

සිංහල ව්‍යඤ්ජන 42	සිංහල ශබ්දය හා රූපය	ක	ඛ	ග	ඝ	ඞ	ච	ඡ	ජ	ඣ	ඤ	ට	ඨ	ඩ	ඪ	ණ	ත	ථ	ද
		ධ	න	ප	ඵ	බ	භ	ම	ය	ර	ල	ව	ශ	ෂ	ස	හ	ළ	ෆ	
		ඟ	ඦ	ඬ	ඳ	ඹ	(අ)ං	(අ)ඃ											
සංස්කෘත ව්‍යඤ්ජන 35	සංස්කෘත ශබ්දය	ක	ඛ	ග	ඝ	ඞ	ච	ඡ	ජ	ඣ	ඤ	ට	ඨ	ඩ	ඪ	ණ	ත	ථ	ද
	දේවනාගර රූපය	क	ख	ग	घ	ङ	च	छ	ज	झ	ञ	ट	ठ	ड	ढ	ण	त	थ	द
	සංස්කෘත ශබ්දය	ධ	න	ප	ඵ	බ	භ	ම	ය	ව	ර	ල	ශ	ෂ	ස	හ	අ(ං)	අ(ඃ)	
	සංස්කෘත රූපය	ध	न	प	फ	ब	भ	म	य	व	र	ल	श	ष	स	ह	अँ	अ(:)	
පාලි ව්‍යඤ්ජන 33	පාලි ශබ්දය හා රූපය	ක	ඛ	ග	ඝ	ඞ	ච	ඡ	ජ	ඣ	ඤ	ට	ඨ	ඩ	ඪ	ණ	ත	ථ	ද
		ධ	න	ප	ඵ	බ	භ	ම	ය	ර	ල	ව	ස	හ	ළ	(අ)ං			

- සිංහල භාෂාවේ ඇති සඤ්ඤක අක්ෂර ඟ, ඦ, ඬ, ඳ, ඹ නාගරී අක්ෂර මාලාවේ ඇතුළත් නොවේ.

- ඌෂ්මාක්ෂර ෆ අක්ෂරය හා මූර්ධජ ළ නාගරී අක්ෂරමාලාවේ ඇතුළත් නොවේ.

- පාලි භාෂාවේ ශ, ෂ යන අක්ෂර ඇතුළත් නොවන අතර (අ)ඃ, ෆ, ඟ, ඦ, ඬ, ඳ, ඹ යන අක්ෂර ද ඇතුළත් නොවේ.

	සිංහල	පාලි	සංස්කෘත
ස්වර	18	08	14
ව්‍යඤ්ජන	42	33	35

ප්‍රත්‍යාහාර වර්ණමාලාව

නාගරී අක්ෂරමාලාවේ අක්ෂර සමූහයක් පමණක් වෙන්කර දැක්වීම සඳහා පමණක් භාවිත වන ක්‍රමය ප්‍රත්‍යාහාර ක්‍රමය ලෙස හැඳින්වේ. එසේ වෙන් කරනු ලබන වර්ණ සමූහයේ මුල අක්ෂරය හා අග අක්ෂරය එක් කිරීමෙන් ප්‍රත්‍යාහාරය නම් කෙරෙයි. මේ සඳහා සංස්කෘත අක්ෂරමාලාව පෙළගස්වා ඇත්තේ මෙසේ ය.

प्रत्याहार अक्षरमाला ।

अ आ इ ई उ ऊ ऋ ॠ ऌ ॡ ए ऐ ओ औ
ह य व र ल ञ ण न ङ म
झ ढ ध घ भ ज ड द ग ब
ख फ छ ठ थ च ट त क प
श ष स

ප්‍රත්‍යාහාර ක්‍රමයට අනුව අක්ෂර පෙළ ගැසෙන අයුරු අධ්‍යයනය කරමු.

හල ප්‍රත්‍යාහාරය	ह य व र ल
ඤම ප්‍රත්‍යාහාරය	ञ ण न ङ म
අබ ප්‍රත්‍යාහාරය	अ आ इ ई उ ऊ ऋ ॠ ऌ ॡ ए ऐ ओ औ ह य व र ल ञ ण न ङ म झ ढ ध घ भ ज ड द ग ब
හස ප්‍රත්‍යාහාරය	ह य व र ल ञ ण न ङ म झ ढ ध घ भ ज ड द ग ब ख फ छ ठ थ च ट त क प श ष स
චප ප්‍රත්‍යාහාරය	च ट त क प

සංයුක්තාක්ෂර

සංයුක්තාක්ෂර යනු බැඳි අකුරුයි. ස්වර රහිත අක්ෂර දෙකක් හෝ වැඩි ගණනක් එක ළඟ බැඳී සිටීම සංයුක්තාක්ෂර නමින් හැඳින්වේ. අක්ෂර බැඳීමේ දී පහත සඳහන් ක්‍රම අනුගමනය කළ හැකි ය.

පළමු ක්‍රමය

- ව්‍යඤ්ජන වර්ණමාලාවේ අක්ෂර 22 ක අග සිරස් රේඛාවක් යෙදේ. [स, ग, म, य...] එබඳු අක්ෂර සංයෝගවීමේ දී අන්තයෙහි ඇති එම සිරස් රේඛාව ඉවත් වේ.

म् + प= म्प > दम्पती प् + त= प्त > गुप्त

ग् + न= ग्न > लग्नवेला

දෙවැනි ක්‍රමය

- සිරස් රේඛාව මැද යෙදෙන අක්ෂර ද වේ. ඒවා ගණනින් [क, फ...] දෙකකි. ඒවා බැඳීමේ දී හරහට මෙන් ම එකක් මත එකක් සිටින ලෙස ද ලිවිය යුතු වේ.

क् + क = क्क / क्क
क् + फ = क्फ

තෙවැනි ක්‍රමය

- බැඳෙන මුල් ව්‍යඤ්ජනයේ සිරස් රේඛාවක් නොමැති නම් එම අක්ෂර බැඳීමේ දී එකක් මත එකක් සිටින ලෙස ලියනු ලැබේ.

द् + द् = द्द   ङ्+ क = ङ्क > अङ्क
ट् + ट = ट्ट

සිවුවැනි ක්‍රමය

- ඇතැම් අකුරු සංයුක්ත වන විට එම අකුරුවල ස්වරූපය සම්පූර්ණයෙන් ම වෙනස් වේ.

क् + ष = क्ष > दक्ष   ज् + न = ज्ञ > ज्ञानी
त् + र = त्र > नेत्र   द् + म = द्म > पद्म

- ව්‍යඤ්ජනයකට පූර්වයෙන් සිටින र् කාරය සංයුක්ත වීමේ දී රේඵය බවට පත්වේ. එය ලියනු ලබන්නේ අක්ෂරයෙහි කෙළවර ඇති සිරස් රේඛාව මුදුනෙනි.

र् + क = र्क > अर्क   र् + ता = र्ता > वार्ता
र् + प = र्प > दर्प   र् + मो = र्मो > धर्मो

- ව්‍යඤ්ජනයකට පර ව සිටි र කාරය රකාරාංශය බවට පත්වේ.

स् + र = स्र > स्रवति   ड्+ र = ड्र > ओड्र
ट् + र = ट्र > दंष्ट्रा

එකතු වීමේ දී විශේෂ රූප ගන්නා සංයුක්තාක්‍ෂර								
क्त ක්ත	क्त्र ක්ත්‍ර	क्ष ක්‍ෂ	ज्ञ ඥ	त्त ත්ත	त्र ත්‍ර	द्म ද්ම	द्य ද්‍ය	श्च ශ්ච
श्र ශ්‍ර	श्व ශ්ව	स्त्र ස්ත්‍ර	श्न ශ්න					
'ර්' හා 'ර' සම්බන්ධ වීමේ දී රේඵය හා රකාරාංශය යෙදෙන සංයුක්තාක්‍ෂර								
र्क ර්‍ක	र्ख ර්‍ඛ	र्ग ර්‍ග	र्घ ර්‍ඝ	र्च ර්‍ච	र्ज ර්‍ජ	र्ण ර්‍ණ	र्त ර්‍ත	र्थ ර්‍ථ
र्द ර්‍ද	र्ध ර්‍ධ	र्प ර්‍ප	र्भ ර්‍භ	र्म ර්‍ම	र्श ර්‍ශ	र्ष ර්‍ෂ	क्र ක්‍ර	ग्र ග්‍ර
घ्र ඝ්‍ර	ज्र ජ්‍ර	ट्र ට්‍ර	ढ्र ඪ්‍ර	ठ्र ඨ්‍ර	ड्र ඩ්‍ර	त्र ත්‍ර	द्र ද්‍ර	ध्र ධ්‍ර
प्र ප්‍ර	ब्र බ්‍ර	भ्र භ්‍ර	म्र ම්‍ර	व्र ව්‍ර	श्र ශ්‍ර	स्र ස්‍ර	ह्र හ්‍ර	

ක්‍රියාකාරකම 2.1

01. පහත දක්වා ඇති අක්‍ෂරවලින් සිංහල භාෂාවේ දක්නට ලැබෙන එහෙත් සංස්කෘත භාෂාවේ නොමැති අක්‍ෂර තෝරා නියමිත ස්ථානයේ යොදන්න.

අ ආ ඇ ඈ ඉ ඊ උ ඌ ඍ ඎ ඏ ඐ එ ඒ ඔ ඕ (අ)ං (අ)ඃ
ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත
ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ශ ෂ ස හ
ළ ෆ ඟ ඦ ඬ ඳ ඹ

සංස්කෘත භාෂාවේ දක්නට
නොමැති අකුරු

02. ප්‍රත්‍යාහාර අක්ෂරමාලාව අධ්‍යයනය කර පහත දැක්වෙන ප්‍රත්‍යහාරවලට අයත් අකුරු නියමිත ස්ථානවල යොදන්න.

अब प्रत्याहार	हस प्रत्याहार	अल प्रत्याहार	हल प्रत्याहार
खस प्रत्याहार	चप प्रत्याहार	जम प्रत्याहार	झभ प्रत्याहार

ක්‍රියාකාරකම 2.2

01. පහත සඳහන් ඡේදය නාගරී අක්ෂර භාවිත කර ලියන්න.

උත්සවෙ, ව්‍යසනෙ දුර්භික්ෂෙ රාෂ්ට්‍රවිප්ලවෙ, දෛනන්දිනව්‍යවහාරෙ ච යඃ සහායතාං කරොති ස බන්ධුඃ භවති. යදි විශ්වෙ සර්වත්‍ර එතාදෘෂටවඃ භාවඃ භවෙත් තදා විශ්වබන්ධුත්වං සමභවති.

පරන්තු අධුනා නිඛිලෙ සංසාරෙ කලහස්‍ය අශාන්තෙඃ ච වාතාවරණම් අස්ති. මානවාඃ පරස්පරං න විශ්වසන්ති. තෙ පරස්‍ය කෂ්ටං ස්වකීයං කෂ්ටං න ගණයන්ති. අපි ච සමර්ථාඃ දෙශාඃ අසමර්ථාන් දෙශා ප්‍රති උපෙක්ෂභාවං ප්‍රදර්ශයන්ති. තෙෂාම් උපරි ස්වකීයං ප්‍රභුත්වං ස්ථාපයන්ති. සංසාරෙ සර්වත්‍ර විද්වෙෂස්‍ය, හිංසායාඃ භාවනා දෘශ්‍යතෙ. දේශානාං විකාසඃ අපි අවරුද්ධඃ භවති.

ඉයං මහතී අවශ්‍යතා වර්තතෙ යත් එකඃ දෙශඃ අපරෙණ දෙශෙන සහ නිර්මලෙන හෘදයෙන බන්ධුතායාඃ ව්‍යවහාරං කුර්යාත්. විශ්වස්‍ය ජනෙෂු ඉයං භාවනා අවශ්‍යකී. තතඃ විකසිතාවිකසිතයොඃ දෙශයොඃ මධ්‍යෙ ස්වස්ථා ස්පර්ධාඃ භවිෂ්‍යති. සර්වෙ දෙශාඃ ඥානවිඥානයොඃ ක්ෂෙත්‍රෙ මෛත්‍රීභාවනයා සහයොගෙන ච සමෘද්ධිං ප්‍රාප්තුං සමර්ථාඃ භවිෂ්‍යන්ති.

සූර්යස්‍ය චන්ද්‍රස්‍ය ච ප්‍රකාශඃ සර්වත්‍ර සමානරූපෙණ ප්‍රසරති. ප්‍රකෘතිඃ අපි සර්වේෂු සමත්වෙන ව්‍යවහරති. තස්මාත් අස්මාභිඃ සර්වෙ පරස්පරං වෛරභාවම් අපහාය විශ්වබන්ධුත්වං ස්ථාපනීයම්.

02. ඉහත සඳහන් ඡේදය අධ්‍යයනය කර පහත වගුව සම්පූර්ණ කරන්න. වචනයේ අදාළ අක්ෂරය යටින් ඉරක් අඳින්න.

මහාප්‍රාණාක්ෂර සහිත වචන	අන්තඃස්ථාක්ෂර සහිත වචන	ඌෂ්මාක්ෂර සහිත වචන	අනුස්වාරය සහිත වචන	වර්ගාන්තාක්ෂර සහිත වචන

ක්‍රියාකාරකම 2.3

01. සංයුක්තාක්ෂර පිළිබඳ ව අධ්‍යයනය කර පහත සඳහන් වගුව පුරවන්න.

රකාරාංශය යෙදී සංයුක්ත වන අක්ෂර	රේඵය යෙදී සංයුක්ත වන අක්ෂර	සංයුක්ත වීමේ දී විශේෂ රූප ගන්නා අක්ෂර

आपत्काले च कष्टेऽपि नोत्साहस्त्यज्यते बुधैः।
ආපත්කාලේ ච කෂ්ටේ පි නෝත්සාහස්ත්‍යජ්‍යතේ බුධෛඃ
විපතේදීත් දුකේදීත් නුවණැත්තන් විසින් උත්සාහය අත් නොහරිනු ලැබේ.

आपत्काले तु संप्राप्ते यन्मित्रं मित्रमेव तत्।
ආපත්කාලේ තු සංප්‍රාප්තේ යන්මිත්‍රං මිත්‍රමේව තත්
විපතේ දී සිටින මිතුරා නියම මිතුරා වේ.

आरब्धा ह्यसमाप्तैव किं धीरैस्त्यज्यते क्रिया।
ආරබ්ධා හ්‍යසමාප්තෛව කිං ධීරෛස්ත්‍යජ්‍යතේ ක්‍රියා
ධෛර්‍යවන්තයෝ අරඹන ලද කටයුත්ත අවසන් නොකොට අත් හරිත් ද?

03
පාඩම
प्रथमः पाठः ।

धर्मात् प्रभवते सुखम् ।

(දහමින් සැපය උපදී.)

नाम परिचयः । - स्वरान्त

විභක්ති යනු බෙදීම යි. සංස්කෘත භාෂාවේ එබඳු බෙදීම් හතකි. ප්‍රථමා (පළමු), ද්විතීයා (දෙවැනි), තෘතීයා (තෙවැනි), චතුර්ථී (සිවුවැනි), පඤ්චමී (පස්වැනි), ෂෂ්ඨී (හයවැනි), සප්තමී (හත්වැනි) යනුවෙන් ඒවා වර්ග කෙරේ. සම්බෝධන යනු ප්‍රථමා විභක්තියෙහි උපවිභක්තියකි.

ස්වරාන්ත නාම

ස්වර අක්ෂරවලින් කෙළවර වන නාම ප්‍රධාන පියවර කිහිපයක් ඔස්සේ හදාරමු.

පළමු පියවර

अ इ उ හා ऋ යන අක්ෂරවලින් කෙළවර වන නාම, බොහෝ විට පුරුෂලිඞ්ගික වේ.

උදාහරණ :-

अकारान्त	अज - गज - अग्रज - अनुज - बालक सारमेय - बिडाल - विहग - शुक - मधुप व्याघ्र - सिंह - वृक्ष - सूर्य - चन्द्र
इकारान्त	मुनि - कपि - रवि - कवि - अहि - असि
उकारान्त	गुरु - साधु - भानु - राहु - केतु
ऋकारान्त	पितृ - भ्रातृ
	शास्तृ

ක්‍රියාකාරකම 3.1

පහත වගුව ඇසුරෙන් ඉහත ශබ්ද ඒකවචනයෙහි වරනගමු.

(වගුව I)

			एकवचन			
	विभक्ति	अ	इ	उ	ऋ	सूत्र
०१.	प्रथमा	ः	ः	ः	आ	
०२.	द्वितीया	म्	म्	म्	र / म्	म्
०३.	तृतीया	एन	ना	ना	त्रा	एन नाना त्रा
०४.	चतुर्थी	आय	ये	वे	ए	आय ये वे ए
०५.	पञ्चमी	आत्	एः	ओः	उः	आत् एः ओः उः
०६.	षष्ठी	स्य	एः	ओः	उः	स्य एः ओः उः
०७.	सप्तमी	ए	औ	औ	रि	ए औ रि

නිදර්ශන වරනැගීම

(වගුව II)

	विभक्ति	अग्रज	मुनि	गुरु	पितृ
०१.	प्रथमा	अग्रजः	मुनिः	गुरुः	पिता
०२.	द्वितीया	अग्रजम्	मुनिम्	गुरुम्	पितरम्
०३.	तृतीया	अग्रजेन	मुनिना	गुरुणा	पित्रा
०४.	चतुर्थी	अग्रजाय	मुनये	गुरवे	पित्रे
०५.	पञ्चमी	अग्रजात्	मुनेः	गुरोः	पितुः
०६.	षष्ठी	अग्रजस्य	मुनेः	गुरोः	पितुः
०७.	सप्तमी	अग्रजे	मुनौ	गुरौ	पितरि

අභ්‍යාසය 3.1

01. ඉහත I වගුවේ එක හා සමාන ප්‍රත්‍යය රූප යෙදෙන ස්ථාන නම් කරන්න.

02. ඉහත II වගුව ඇසුරින් පහත වගුවේ හිස්තැන් පුරවන්න.

	विभक्ति	बिडाल	कपि	साधु	भ्रातृ
०१.	प्रथमा	बिडालः		साधुः	भ्राता
०२.	द्वितीया				भ्रातरम्
०३.	तृतीया		कपिना		
०४.	चतुर्थी	बिडालाय		साधवे	
०५.	पञ्चमी	बिडालात्		साधोः	
०६.	षष्ठी		कपेः		भ्रातुः
०७.	सप्तमी				भ्रातरि

අභ්‍යාසය 3.2

01. පහත III වගුව අධ්‍යයනය කර එක හා සමාන රූප ඇති අවස්ථා නම් කරන්න.

(වගුව III)

द्विवचन						
	विभक्ति	अ	इ	उ	ऋ	सूत्र
०१.	प्रथमा	औ	ई	ऊ	रौ	रौ / ई / ऊ /औ
०२.	द्वितीया	औ	ई	ऊ	रौ	रौ / ई / ऊ /औ
०३.	तृतीया	भ्याम्	भ्याम्	भ्याम्	भ्याम्	भ्याम्
०४.	चतुर्थी	भ्याम्	भ्याम्	भ्याम्	भ्याम्	भ्याम्
०५.	पञ्चमी	भ्याम्	भ्याम्	भ्याम्	भ्याम्	भ्याम्
०६.	षष्ठी	योः	योः	वोः	त्रोः	ओः
०७.	सप्तमी	योः	योः	वोः	त्रोः	ओः

(වගුව IV)

द्विवचन						
	विभक्ति	बिडाल	कपि	साधु	भ्रातृ	सूत्र
०१.	प्रथमा	बिडालौ	कपी	साधू	भ्रातरौ	औ / ई / ऊ / रौ
०२.	द्वितीया	बिडालौ	कपी	साधू	भ्रातरा	औ / ई / ऊ / रौ
०३.	तृतीया	बिडालाभ्याम्	कपिभ्याम्	साधुभ्याम्	भ्रातृभ्याम्	भ्याम्
०४.	चतुर्थी	बिडालाभ्याम्	कपिभ्याम्	साधुभ्याम्	भ्रातृभ्याम्	भ्याम्
०५.	पञ्चमी	बिडालाभ्याम्	कपिभ्याम्	साधुभ्याम्	भ्रातृभ्याम्	भ्याम्
०६.	षष्ठी	बिडालयोः	कप्योः	साध्वोः	भ्रात्रोः	ओः
०७.	सप्तमी	बिडालयोः	कप्योः	साध्वोः	भ्रात्रोः	ओः

02. ඉහත IV වගුව ඇසුරෙන් පහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

द्विवचन					
	विभक्ति	अग्रज	मुनि	गुरु	पितृ
०१.	प्रथमा	अग्रजौ	मुनी		
०२.	द्वितीया			गुरू	
०३.	तृतीया	अग्रजाभ्याम्			पितृभ्याम्
०४.	चतुर्थी		मुनिभ्याम्		
०५.	पञ्चमी			गुरुभ्याम्	
०६.	षष्ठी		मुन्योः		पित्रोः
०७.	सप्तमी	अग्रजयोः		गुर्वोः	

(වගුව V)

बहुवचन						
	विभक्ति	अ	इ	उ	ऋ	सूत्र
०१.	प्रथमा	आः	यः	वः	रः	आयवरः
०२.	द्वितीया	आन्	ईन्	ऊन्	तॄन्	न्
०३.	तृतीया	ऐः	भिः	भिः	भिः	ऐः / भिः
०४.	चतुर्थी	एभ्यः	भ्यः	भ्यः	भ्यः	भ्यः
०५.	पञ्चमी	एभ्यः	भ्यः	भ्यः	भ्यः	भ्यः
०६.	षष्ठी	आनाम्	नाम्	नाम्	नाम्	नाम्
०७.	सप्तमी	एषु	षु	षु	षु	षु

අභ්‍යාසය 3.3

- ඉහත V වැනි වගුවේ සමාන රූප යෙදී ඇති අවස්ථා වෙන් කර දක්වන්න.
- ඉහත V වැනි වගුව ඇසුරෙන් පහත වගුවේ හිස්තැන් පුරවන්න.

बहुवचन						
	विभक्ति	बिडाल	कपि	साधु	पितृ	सूत्र
०१.	प्रथमा	बिडालाः		साधवः		आयवरः
०२.	द्वितीया		कपीन्		पितॄन्	न्
०३.	तृतीया	बिडालैः		साधुभिः		ऐः / भिः
०४.	चतुर्थी		कपिभ्यः			भ्यः
०५.	पञ्चमी	बिडालेभ्यः			पितृभ्यः	भ्यः
०६.	षष्ठी		कपीनाम्		पितॄणाम्	नाम्
०७.	सप्तमी	बिडालेषु		साधुषु		षु

පුනරීක්ෂණ

(වගුව VI)

अ इ उ ऋ - पुरुषलिङ्गिक			
विभक्ति	*एकवचन*	*द्विवचन*	*बहुवचन*
प्रथमा	ः / आ	औ / ई / ऊ	आयवरः
द्वितीया	म्	औ / ई / ऊ	न्
तृतीया	एन ना ना त्रा	भ्याम्	ऐः / भिः
चतुर्थी	आय ये वे ए	भ्याम्	भ्यः
पञ्चमी	आत् एः ओः उः	भ्याम्	भ्यः
षष्ठी	स्य एः ओः उः	ओः	नाम्
सप्तमी	ए औ रि	ओः	षु

स्वरान्त - स्त्रीलिङ्गिकनाम

आ ई ऊ යන දීර්ඝ ස්වරවලින් අවසන් වෙන නාම, බොහෝ විට ස්ත්‍රීලිඞ්ගික වේ.

(වගුව VII)

आकारान्त	माला - शाला - लङ्का - गङ्गा - वनिता - कन्या
ईकारान्त	नदी - देवी - कुमारी
ऊकारान्त	वधू

අභ්‍යාසය 3.4

01. वनिता ශබ්දයට පහත සඳහන් ප්‍රත්‍යය එකතු කර නැවත ලියන්න.

	विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
०१.	प्रथमा	x	ए	x ः
०२.	द्वितीया	x म्	ए	x ः
०३.	तृतीया	वनितया	x भ्याम्	x भिः
०४.	चतुर्थी	x यै	x भ्याम्	x भ्यः
०५.	पञ्चमी	x याः	x भ्याम्	x भ्यः
०६.	षष्ठी	x याः	वनितयोः	x नाम्
०७.	सप्तमी	x याम्	वनितयोः	x सु

02. ඉහත වගුව ඇසුරෙන් **माला** ශබ්දය සියලු විභක්තිවල වරනගන්න.

අභ්‍යාසය 3.5

01. සංස්කෘතයට පරිවර්තනය කරන්න.

1. වනිතාවෝ ....
2. ශාලාවෙහි ....
3. මල්මාලාවලින් ....
4. කන්‍යාවට ....
5. වනිතාවන්ගේ ....
6. කන්‍යාවන් කෙරෙහි ....
7. ගංගාවන්හි ....
8. වැල් දෙකෙන් ....
9. ශාලා දෙකෙහි ....
10. කන්‍යාවන් විසින් ....

02. පහත රූපයන්ට අදාළ විභක්තිය ලියන්න.

१. मालाम् ....
२. कन्याभिः ....
३. लतया ....
४. लङ्कायाम् ....
५. कन्यानाम् ....
६. लतासु ....
७. मालयोः ....
८. गङ्गासु ....
९. वनिताः ....
१०. मालाभ्याम् ....

ईकारान्त - ऊकारान्त ශබ්ද

(වගුව VIII)

	विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
०१.	प्रथमा	x	औ	यः / वः
०२.	द्वितीया	x म्	औ	x ः
०३.	तृतीया	या / वा	x भ्याम्	x भिः
०४.	चतुर्थी	x यै / वै	x भ्याम्	x भ्यः
०५.	पञ्चमी	x याः/ वाः	x भ्याम्	x भ्यः
०६.	षष्ठी	x याः/ वाः	ओः	x नाम्
०७.	सप्तमी	x याम् / वाम्	ओः	x षु

ईकारान्त ශබ්දවල දී තෘතීයා ඒකවචනයෙහි සිට සප්තමී ඒකවචනය දක්වා යෙදෙන රූප, **ऊकारान्त** වල දී **वा - वै - वाः - वाः - वाम्** ලෙස යෙදේ.

- ඉහත VIII වගුව ආශ්‍රයෙන් **नदी** හා **वधू** ශබ්දයන්හි ඒකවචන රූප හඳුනාගනිමු.

ई	ऊ	
नद्या	वध्वा	आ
नद्यै	वध्वै	ऐ
नद्याः	वध्वाः	आः
नद्याः	वध्वाः	आः
नद्याम्	वध्वाम्	आम्

අභ්‍යාසය 3.6

01. **कुमारी** හා **देवी** යන ශබ්දයන්හි එකවචන රූප ලියන්න.

02. **नदी** හා **वधू** ශබ්ද වරනැගීමෙහි ඇති සමාන රූප යෙදෙන අවස්ථා වගුගත කරන්න.

आ - ई - ऊ අන්ත ස්ත්‍රීලිඞ්ගික ප්‍රත්‍යය මාලාව				
	विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
०१.	प्रथमा	x	ए /औ	: / यः / वः
०२.	द्वितीया	x म्	ए /औ	x :
०३.	तृतीया	आ	x भ्याम्	x भिः
०४.	चतुर्थी	ऐ	x भ्याम्	x भ्यः
०५.	पञ्चमी	आः	x भ्याम्	x भ्यः
०६.	षष्ठी	आः	ओः	x नाम्
०७.	सप्तमी	आम्	ओः	x षु

ऋकारान्त स्त्रीलिङ्ग

मातृ - स्वसृ - दुहितृ යනාදි ශබ්ද ස්ත්‍රීලිඞ්ගික ඍකාරාන්ත ශබ්ද වේ. ඒවා පුරුෂලිඞ්ගික ඍකාරාන්ත **पितृ - भ्रातृ** ආදි ශබ්ද ලෙස ම වරනැගේ. ලිඞ්ගද්වය අතර ඇත්තේ එක ම වෙනසකි.

द्वितीया विभक्ति			
पुरुषलिङ्गिक	पितरम्	पितरौ	पितॄन्
स्त्रीलिङ्गिक	मातरम्	मातरौ	मातॄः

අභ්‍යාසය 3.7

01. පහත සඳහන් **मातृ** ශබ්දයෙහි හිස්තැන් පුරවන්න.

02. ඒ හිස්තැන්වල රූපයන්හි සිංහල අර්ථ ලියන්න.

	मातृ			
	विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
०१.	प्रथमा			
०२.	द्वितीया	मातरम्		
०३.	तृतीया	मात्रा		मातृभिः
०४.	चतुर्थी			
०५.	पञ्चमी			
०६.	षष्ठी		मात्रोः	
०७.	सप्तमी	मातरि		मातृषु

ක්‍රියාකාරකම 3.2

स्वरान्त - नपुंसकलिङ्गिकनाम

अकारान्त	पुस्तक - पीठ - पुष्प - पात्र - नेत्र - भाजन - गृह - वन
इकारान्त	ශබ්ද සොයා ලියන්න.
उकारान्त	ශබ්ද සොයා ලියන්න.

अकारान्त - पुष्प

	पुष्प			
	विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
०१.	प्रथमा	पुष्पम्	पुष्पे	पुष्पाणि
०२.	द्वितीया	पुष्पम्	पुष्पे	पुष्पाणि
०३.	तृतीया සිට सप्तमी දක්වා	සෙසු රූප පුරුෂලිඞ්ගයෙහි මෙනි.		

අභ්‍යාසය 3.8

- සුදුසු පරිදි හිස්තැන් පුරවන්න.

	द्वितीया एकवचन	तृतीया बहुवचन	चतुर्थी द्विवचन	पञ्चमी एकवचन	षष्ठी बहुवचन	सप्तमी एकवचन
नेत्र						
पात्र						
गृह						
पीठ						
पुस्तक						

उदारचरितानां तु वसुधैव कुटुम्बकम्।
උදාරචරිතානාං තු වසුධෛව කුටුම්බකම්
උතුම් චරිත ඇති අයට මුළු ලොව ම එක පවුලකි.

उद्यमेन हि सिद्ध्यन्ति कार्याणि न मनोरथैः।
උද්‍යමේන හි සිද්ධ්‍යන්ති කාර්යාණි න මනෝරථෛඃ
උත්සාහයෙන් ම කටයුතු සිදු වේ. සිතිවිලිවලින් සිදු නොවේ.

उपदेशो हि मूर्खाणां प्रकोपाय न शान्तये।
උපදේශෝ හි මූර්ඛාණාං ප්‍රකෝපාය න ශාන්තයේ
මෝඩයන්ට උපදෙස් දීම ඔවුන්ගේ කෝපය පිණිස වේ. සැනසුම පිණිස නොවේ.

04
පාඩම
चतुर्थः पाठः ।

अपि सर्वं कुशलम् ?

(සුවදුක් කෙසේ ද?)

नाम परिचयः । २ - हलन्त

හලන්ත හෙවත් හසාන්ත යනු ව්‍යඤ්ජන අක්ෂරවලින් කෙළවර වන නාමයන් ය. ව්‍යඤ්ජන අක්ෂර 33න් ද අන්ත වන ශබ්ද විරල ය. බහුල ව භාෂාවේ භාවිත වනුයේ क् - ख् - च् - ज् - त् - द् - ध् - न् - र् - ब् - भ् - स् - श् යනාදි ව්‍යඤ්ජන අක්ෂරවලින් කෙළවර වන ශබ්ද ය. හසාන්ත ශබ්ද ද ස්ත්‍රීලිඞ්ගික, පුරුෂලිඞ්ගික හා නපුංසකලිඞ්ගික වශයෙන් ලිඞ්ගත්‍රයෙහි ම යෙදේ.

(වගුව I)

पुरुषलिङ्ग	पुंस् - चित्रलिख् - भिषज् - मरुत् - गुणवत् - राजन् - विद्वस् - द्विपाद्
स्त्रीलिङ्ग	वाच् - सरित् - समिध् - सम्पद् - विपद् - क्षुध् - द्वार्
नपुंसकलिङ्ग	सर्वशक् - सुवाच् - असृज् - सद्मन् - वार् - मनस् - आयुष्

හලන්ත ශබ්ද වරනැඟීමේ දී බොහෝ වෙනස්කම් ප්‍රථමා විභක්ති ඒකවචනයෙහි පමණක් දක්නට ලැබේ.

(වගුව II)

हसान्त	प्रथमाविभक्ति एकवचन
क् - ख् - च् - ज् අන්ත ශබ්ද	क्
त् - द् - ध्	त्
र्	:
ब् - भ्	प्

අභ්‍යාසය 4.1

01. ඉහත II වගුව අනුසාරයෙන් පහත ශබ්දයන්හි ප්‍රථමා විභක්ති ඒකවචන රූප ලියන්න.

चित्रलिख् - भिषज् - मरुत् - सरित् - द्विपाद्
जलमुच् - सुवाच् - वणिज् - विपद् - समिध् - द्वार्

හලන්ත ශබ්ද අතර न् කාරාන්ත ශබ්දයන්හි ප්‍රථමා විභක්ති ඒකවචනයේ අන්තයෙහි ඇති न් ලොප් වේ. එසේ ම ඊට පෙර ඇති අක්ෂරය දීර්ඝ වේ.

උදාහරණ :- राजन् - राजा
आत्मन् - आत्मा

स् කාරාන්ත ශබ්ද වරනැගීම ද සුවිශේෂ වේ. विद्वस् ශබ්දය, विद्वान् ලෙස ද पुंस् ශබ්දය, पुमान् ලෙස ද ප්‍රථමා විභක්ති ඒකවචනයෙහි වරනැගේ.

අභ්‍යාසය 4.2

- महिमन् - ब्रह्मन् - तक्षन् - करिन् - दण्डिन् - धनिन् - हस्तिन् - विद्यार्थिन्

යන ශබ්දයන්හි ප්‍රථමා විභක්ති ඒකවචන රූප ලියන්න.

හලන්ත ශබ්දවල ලිඞ්ගත්‍රයෙහි ම පහත සඳහන් ස්ථානයන්හි එක හා සමාන ප්‍රත්‍යය භාවිත වේ.

(වගුව III)

एकवचन			
द्वितीया	अम्	मरुतम्	भिषजम्
तृतीया	आ	मरुता	भिषजा
चतुर्थी	ए	मरुते	भिषजे
पञ्चमी	अः	मरुतः	भिषजः
षष्ठी	अः	मरुतः	भिषजः
सप्तमी	इ	मरुति	भिषजि

අභ්‍යාසය 4.3

01. ඉහත වගුව III රටාවට අනුව පහත ශබ්දයන්හි ද්විතීයාවෙහි සිට සප්තමී දක්වා ඒකවචන රූප ලියන්න.

चित्रलिख् - भिषज् - मरुत् - गुणवत् - द्विपाद्

जलमुच् - सुवाच् - वणिज् - विपद् - द्वार्

02. උදාහරණ රටාවට අනුව හිස්තැන් පුරවන්න.

प्रथमा विभक्ति रूपाणि				
		एकवचन	द्विवचन	बहुवचन
			औ	अः
०१.	मरुत्	✓	मरुतौ	मरुतः
०२.	वाच्	✓		
०३.	विपद्	✓		
०४.	सरित्	✓		
०५.	द्विपाद्	✓		
०६.	समिध्	✓		
०७.	द्वार्	✓		

03. උදාහරණ රටාවට අනුව හිස්තැන් පුරවන්න.

द्वितीया विभक्ति रूपाणि				
	द्वितीयाविभक्ति	एकवचन	द्विवचन	बहुवचन
		अम्	औ	अः
०१.	मरुत्	मरुतम्	मरुतौ	मरुतः
०२.	वाच्			
०३.	चित्रलिख्			
०४.	सरित्			

०५.	द्विपाद्			
०६.	समिध्			
०७.	द्वार्			
०८.	भिषज्			
०९.	सर्वशक्			
१०.	विपद्			

स् කාරාන්ත - विद्वस् හා पुंस् ශබ්දයන්හි ද්විතීයා විභක්ති බහුවචන රූප विदुषः - पुंसः යනාදි ලෙස සිටී. राजन् ශබ්දයෙහි राज्ञः ලෙස විශේෂ රූපයක් ගනී. විශේෂයෙන් ද්විතීයා විභක්ති බහුවචනය සඳහා භාවිත වනුයේ පඤ්චමී හෝ ෂෂ්ඨී ඒකවචන රූප ම වේ.

(වගුව IV)

विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
तृतीया	आ	भ्याम्	भिः
चतुर्थी	ए	भ्याम्	भ्यः
पञ्चमी	अः	भ्याम्	भ्यः
षष्ठी	अः	ओः	आम्
सप्तमी	इ	ओः	सु / षु

හසාන්ත ශබ්දයන්හි තෘතීයාවෙහි සිට ද්විවචන රූප සාධනයේ දී පහත පරිදි අක්ෂර වෙනස් වේ.

क् - ख् - च् - ज्	⟶	ग्
त् - ध्	⟶	द्
न्	⟶	(न् ලොප් වේ.)
र्	⟶	र्

අභ්‍යාසය 4.4

- ඉහත රීතින්ට අනුව පහත දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

	तृतीया द्विवचन	चतुर्थी बहुवचन	पञ्चमी द्विवचन	षष्ठी बहुवचन	सप्तमी द्विवचन
सर्वशक्					
भिषज्					
मरुत्					
राजन्					
वाच्					
सरित्					
सम्पद्					
द्वार्					
द्विपाद्					
समिध्					

हसान्त - नपुंसकलिङ्गिकनाम

(වගුව V)

विभक्ति	एकवचन	द्विवचन	बहुवचन
प्रथमा	x	x ई	इकार सहित जम - आदेश
द्वितीया	ඉහත ප්‍රත්‍යය ම යෙදේ.		
තෘතීයාවෙහි සිට සෙසු රූප පුරුෂලිඞ්ගයෙහි මෙනි.			

අභ්‍යාසය 4.5

01. උදාහරණයට අනුව හිස්තැන් පුරවන්න.

सर्वशक्	-	सर्वशक्	सर्वशकी	सर्वशङ्कि
असृज्	-	असृज्	....	असृञ्जि
सुवाच्	-	....	....	....
हरित्	-	....	....	....
मुञ्चत्	-	....	....	....
चरत्	-	....	....	....

අභ්‍යාසය 4.6

01. පහත ශබ්දයන්හි ද්විතීයා විභක්ති බහුවචන රූපය ලියන්න.

वृक्ष - रवि - भानु - दुहितृ - जामातृ - कर्तृ - पुस्तक - देवी - गङ्गा - वधू

02. පහත සඳහන් ශබ්දයන්හි විභක්තිය හා වචනය ලියන්න.

अग्रजैः - मुनीनाम् - धेन्वै - पुत्रेभ्यः - शुकम्

देव्यः - लतायाम् - भान्वोः - बिडालेषु - वधूः

නොමිලේ බෙදා හැරීම පිණිසයි

03. සුදුසු පරිදි හිස්තැන් පුරවන්න.

	प्रथमा एकवचन	द्वितीया बहुवचन	तृतीया एकवचन	चतुर्थी बहुवचन	सप्तमी एकवचन
सुवाच् -	....	....	....	....	....
द्विपाद् -	....	....	....	....	....
राजन् -	....	....	....	....	....
समिध् -	....	....	....	....	....
सर्वशक् -	....	....	....	....	....
मरुत् -	....	....	....	....	....
द्वार् -	....	....	....	....	....
ब्रह्मन् -	....	....	....	....	....
असृज् -	....	....	....	....	....
भिषज् -	....	....	....	....	....
विद्वस् -	....	....	....	....	....
पुंस् -	....	....	....	....	....

उष्णो दहति चाङ्गारः शीतः कृष्णायते करम्।
උෂ්ණෝ දහති චාඞ්ගාරඃ ශීතඃ කෘෂ්ණායතේ කරම්
උණුසුම් කළ අඟුරු අත දවයි. සිසිල් වූ අඟුරු අත කළු කරයි.

क्षणशः कणशश्चैव विद्यामर्थं च साधयेत्।
ක්‍ෂණශඃ කණශශ්චෛව විද්‍යාමර්ථං ච සාධයේත්
ටිකෙන් ටික සතෙන් සතේ ශාස්ත්‍රය හා ධනය උපයා ගත යුතු ය.

कः परः प्रियवादिनाम् ?
කඃ පරඃ ප්‍රියවාදිනාම් ?
ප්‍රියකථා ඇත්තවුන්ට පිටස්තරයකු වන්නේ කවරෙක් ද?

05
පාඩම
पञ्चमः पाठः ।

अस्ति कश्चिद्वाग्विशेषः ?

(උගත් යමක් වෙයි ද?)

आख्यात परिचयः । १ - लट् / लङ्

සංස්කෘතයෙහි ආඛ්‍යාත පද ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. පරස්මෛපද හා ආත්මනේ පද වශයෙනි. මේ දෙකේ අර්ථයෙහි කිසිදු වෙනසක් දක්නට නැතත්, ක්‍රියාවේ ඵලය අනුන් සතු නම් පරස්මෛ පදයෙහි ද, ක්‍රියාවේ ඵලය තමන් සතු නම් ආත්මනේ පදයෙහි ද යෙදේ. ඇතැම් ධාතු පරස්මෛ පදයෙහි පමණක් ද, ඇතැම් ධාතු ආත්මනේ පදයෙහි පමණක් ද, ඇතැම් ධාතු උභයපදයෙහි ම වරනැගේ.

පරස්මෛ පද	ආත්මනේ පද	උභය පද
පරස්මෛ ක්‍රියා පද	ආත්මනේ ක්‍රියා පද	පරස්මෛ / ආත්මනේ ක්‍රියාපද
√ गम् > गच्छति	√ कम्प् > कम्पते	√ पच् > पचति / पचते
√ पठ् > पठति	√ भाष् > भाषते	√ कृ > करोति / कुरुते
√ पा > पिबति	√ लभ् > लभते	√ याच् > याचति / याचते
√ लिख् > लिखति	√ सेव् > सेवते	√ लुञ् > लुनाति / लुनीते
√ चल् > चलति	√ ज्ञा > ज्ञायते	√ चिञ् > चिनोति / चिनुते

වර්තමාන කාලය ලට් (පරස්මෛපද)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

पुरुष	एक	द्वि	बहु	एक	द्वि	बहु
प्रथम	ति	तः	न्ति	पठति	पठतः	पठन्ति
मध्यम	सि	थः	थ	पठसि	पठथः	पठथ
उत्तम	मि	वः	मः	पठामि	पठावः	पठामः

එහි සිංහල අර්ථය

පුරුෂ	ඒකවචන	ද්විවචන	බහුවචන
ප්‍රථමපුරුෂ	පාඩම් කරයි	(දෙදෙන) පාඩම් කරත්	පාඩම් කරති
මධ්‍යමපුරුෂ	පාඩම් කරහි	(දෙදෙන) පාඩම් කරහු	පාඩම් කරහු
උත්තමපුරුෂ	පාඩම් කරමි	(දෙදෙන) පාඩම් කරමු	පාඩම් කරමු

වර්තමාන කාලය ලට් (ආත්මනේපද)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

पुरुष	एक	द्वि	बहु	एक	द्वि	बहु
प्रथम	ते	एते	न्ते	भाषते	भाषेते	भाषन्ते
मध्यम	से	एथे	ध्वे	भाषसे	भाषेथे	भाषध्वे
उत्तम	ए	वहे	महे	भाषे	भाषावहे	भाषामहे

ක්‍රියාකාරකම 5.1

01. ඉහතින් දැක්වුණු ලට් ලකාරයට අනුව පහත ක්‍රියාපද වරනගමු.

अटति - ඇවිදියි	अस्यति - විසිකරයි	इच्छति - කැමතිවෙයි	कथयति - කියයි
चलति - සෙලවෙයි	क्षाम्यति - කමාකරයි	कृन्तति - කපයි	पूजयति - පුදයි
जीवति - ජීවත්වෙයි	नश्यति - නැසෙයි	क्षिपति - විසිකරයි	छादयति - සඟවයි
रक्षति - රකියි	शाम्यति - සංසිඳෙයි	लिम्पति - පාටකරයි	भूषयति - සරසයි
व्रजति - යයි	शुष्यति - වියළෙයි	विशति - පිවිසෙයි	प्रीणयति - පිනවයි
शंसति - පසසයි	नृत्यति - නටයි	सिञ्चति - ඉසියි	क्षालयति - සෝදයි
चुम्बति - සිඹියි	श्रुणोति - අසයි	सृजति - මවයි	पृच्छति - විචාරයි
जल्पति - දොඩමලුවෙයි	मुष्णाति - සොරකම් කරයි	वर्णयति - වර්ණනා කරයි	पालयति - පාලනය කරයි
बध्नाति - බඳියි	जानाति - දනියි	गृह्णाति - ගනියි	पुनाति - පවිත්‍ර කරයි
अश्नाति - අනුභව කරයි	करोति - කරයි	शिक्षयति - උගන්වයි	लुनाति - සිඳියි

අභ්‍යාසය 5.1

01. ඡේදයේ වරහන් තුළ ඇති සිංහල ක්‍රියාපදයට අනුව ලට් ලකාර ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

मम विद्यालयः।

मम विद्यालयः अतिविशालः। अस्माकं विद्यालये सहस्रछात्राः पठन्ति। तत्र ते परस्परम् आनन्देन ....। (√ मिल् - හමුවෙත්) छात्राः पुस्तकानि लेखन्यः च विद्यालयं................। (√ नय् - ගෙනයත්) आदौ छात्राः बुद्धवन्दनं कुर्वन्ति गुरुं च ....। (प्र + √ नम् - වඳිත්) ततः अध्यापकाः विविधान् विषयान् फलके ....। (√ लिख् - ලියත්) शतं अध्यापकाः अध्यापिका च कार्यं ....। (√ कृ - කරත්) अस्माकं विद्यालये विशालं क्रीडाङ्गणम् ....। (√ अस् - ඇත) ते क्रीडाङ्गणे क्रीडन्ति। केचित् छात्राः कन्दुकेन ....। (√ क्रीड् - ක්‍රීඩාකරත්) अन्ये धावन्ति अपरे च ....। (उत् + √ पत् - උඩපනිත්) अध्यापकाः च मार्गदर्शनं कुर्वन्ति। अस्माकं विद्यालये विशालः पुस्तकालयः अपि अस्ति। तत्र ते तूष्णीम्................। (√ पठ् - ඉගෙනගනිත්) अस्माकं विद्यालये उपवनम् अस्ति। तत्र अनेकानि पुष्पाणि ....। (√ अस् - වෙත්) मालाकारः उपवनं................। (√ रक्ष् - රකී) वयम् उपवने अन्यैः छात्रैः सह पाठं ....। (√ पठ् - පාඩම් කරමු) व्यायामः कुर्मः क्रीडामः च।

අභ්‍යාසය 5.2

01. හිස්තැන් පුරවන්න.

पुरुष	एकवचन	द्विवचन	बहुवचन	ඒකවචන	ද්විවචන	බහුවචන
प्रथमपुरुष	करोति			කරයි		
मध्यमपुरुष		कुरुथः			දෙදෙන කරහු	
उत्तमपुरुष			कुर्मः			කරමු

අභ්‍යාසය 5.3

01. පහත දැක්වෙන ක්‍රියාපදවල පුරුෂය, වචනය හා තේරුම ලියන්න.

		පුරුෂය	වචනය	තේරුම
१. गच्छति	-	प्रथमपुरुष	एकवचन	යයි
२. यच्छन्ति	-	....	....	....
३. जयसि	-	....	....	....
४. दशतः	-	....	....	....
५. जिघ्रामः	-	....	....	....
६. विशतः	-	....	....	....
७. हरथः	-	....	....	....
८. गायामि	-	....	....	....
९. कर्षावः	-	....	....	....
१०. राजन्ति	-	....	....	....

අභ්‍යාසය 5.4

01. ලට් ආත්මනේපද ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

पुरुष	एकवचन	द्विवचन	बहुवचन
प्रथमपुरुष	लभते		
मध्यमपुरुष		लभेथे	
उत्तमपुरुष			लभामहे

एकवचन	द्विवचन	बहुवचन
वर्धते		
		वर्धध्वे
	वर्धावहे	

අභ්‍යාසය 5.5

01. ලට් ආත්මනේ ක්‍රියාපද යොදා හිස්තැන් පුරවන්න.

१. दरिद्रः कष्टं ………….. । √ सह् - (දිළින්දා දුක් උසුලයි.)

२. वृक्षः वातेन ………….. । √ कम्प् - (ගස සුළඟින් සෙලවෙයි.)

३. कीटः सस्यं ………….. । √ बाध् - (පණුවා ගොයමට බාධා කරයි.)

४. छात्रौ श्लोकं ………….. । √ भाष् - (ශිෂ්‍යයෝ දෙදෙනා ශ්ලෝකය කියත්.)

५. आचार्यः चतुरान् छात्रान्………….. । √ सेव् - (ගුරුවරයා දක්ෂ සිසුන් ඇසුරු කරයි.)

අතීතකාලය ලඞ් (පරස්මෛපද)

අතීතයේ කළ ක්‍රියාවක් හඟවනු පිණිස යෙදෙන ක්‍රියාපද අතීත ආඛ්‍යාත යනුවෙන් හැඳින්වේ. අතීත ආඛ්‍යාත තුන් වර්ගයක් ම සංස්කෘත භාෂාවේ භාවිත වේ.

1. අනද්‍යතනාතීත 'ලඞ්' - ඊයේ පටන් ගෙවීගිය අතීතය
2. භූතෙ 'ලුඞ්' - නුදුරු (එදින ම සිදු වූ) අතීතය
3. පරොක්‍ෂා 'ලිට්' - පෙර නොදුටු විරූ අතීතය

සංස්කෘත භාෂාවේ බහුල ව ම යෙදෙන අතීත ලකාරය වන්නේ **අනද්‍යතනාතීත** 'ලඞ්' ලකාර ආඛ්‍යාතය යි. ඊයේ පටන් ගෙවී ගිය කාලය තුළ සිදු කළ ක්‍රියාවක් දැක්වීමේ දී මෙම ආඛ්‍යාතය යොදයි. (අනද්‍යතනාතීත > න + අද්‍යතන + අතීත > අද නොවූ අතීත) මෙම පාඩමේ දී ඔබේ අවධානයට යොමු කරනුයේ බහුල ව භාවිත වන **අනද්‍යතනාතීත** 'ලඞ්' ලකාර ආඛ්‍යාතය පිළිබඳ ව පමණි.

වර්තමාන ලට්		අතීත 'ලඞ්'		
गच्छति ।	(යයි)	अ + गच्छ + त्	अगच्छत् । -	(ගියේ ය.)
पतति ।	(වැටෙයි)	अ + पत + त्	अपतत् । -	(වැටුණේ ය.)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැඟීම

पुरुष	एक	द्वि	बहु	एक	द्वि	बहु
प्रथम	त्	ताम्	अन्	अपठत्	अपठताम्	अपठन्
मध्यम	स् (:)	तम्	त	अपठः	अपठतम्	अपठत
उत्तम	अम्	व	म	अपठम्	अपठाव	अपठाम

එහි සිංහල අර්ථය

පුරුෂ	ඒකවචන	ද්විවචන	බහුවචන
ප්‍රථමපුරුෂ	පාඩම් කළේ ය / කළා ය	(දෙදෙන) පාඩම් කළෝ ය	පාඩම් කළෝ ය/කළහ
මධ්‍යමපුරුෂ	පාඩම් කළෙහි	(දෙදෙන) පාඩම් කළෙහු	පාඩම් කළෙහු
උත්තමපුරුෂ	පාඩම් කළෙමි	(දෙදෙන) පාඩම් කළෙමු	පාඩම් කළෙමු

අතීතකාලය ලඞ් (ආත්මනේපද)

ප්‍රත්‍යය සහ නිදර්ශන වරනැගීම

पुरुष	एक	द्वि	बहु	एक	द्वि	बहु
प्रथम	त	एताम्	अन्त	असहत	असहेताम्	असहन्त
मध्यम	थाः	एथाम्	ध्वम्	असहथाः	असहेथाम्	असहध्वम्
उत्तम	ए	वहि	महि	असहे	असहावहि	असहावहि

ක්‍රියාකාරකම 5.2

01. පහත ක්‍රියාපද ලඞ් ලකාරයෙහි වරනගමු.

ලට්	ලඞ්	ලට්	ලඞ්
चलति - සෙලවෙයි.	अचलत् - සෙලවුණේ ය.	पश्यति - බලයි.	अपश्यत् - බැලුවේ ය.
जीवति - ජීවත්වෙයි.	अजीवत् - ජීවත් වුණේ ය.	पतति - වැටෙයි.	अपतत् - වැටුණේ ය.
रक्षति - රකියි.	अरक्षत् - රැක්කේ ය.	पठति - හදාරයි.	अपठत् - හැදෑරුවේ ය.
पृच्छति - විචාරයි.	अपृच्छत् - විචාළේ ය.	मिलति - හමුවෙයි.	अमिलत् - හමුවූයේ ය.
क्षिपति - විසිකරයි.	अक्षिपत् - විසිකළේ ය.	चरति - හැසිරෙයි.	अचरत् - හැසිරුණේ ය.
कथयति - කියයි.	अकथयत् - කීවේ ය.	तिष्ठति - සිටියි.	अतिष्ठत् - සිටියේ ය.
क्षालयति - සෝදයි.	अक्षालयत् - සේදුවේ ය.	खादति - කයි.	अखादत् - කෑවේ ය.
पूजयति - පුදයි.	अपूजयत् - පිදුවේ ය.	करोति - කරයි.	अकरोत् - කළේ ය.

අභ්‍යාසය 5.6

01. පහත සඳහන් හිස්තැන්වලට අදාළ පද නිවැරදි ව ලියන්න.

ලට් ක්‍රියාව	වර්තමාන තේරුම	ලඞ් ක්‍රියාව		අතීත තේරුම
१. पठति	- පාඩම් කරයි.	अपठत्	-	පාඩම් කළේ ය.
२. क्रीडन्ति	-	....	-	ක්‍රීඩා කළහ.
३. तिष्ठसि	-	अतिष्ठः	-	....
४. चरथः	- දෙදෙන හැසිරෙහු.	....	-	....
५. निन्दामि	-	....	-	නින්දා කළෙමි.
६. तुष्यतः	- දෙදෙන සතුටුවෙත්.	....	-	....
७. खादामः	-	अखादाम	-	....
८. रक्षति	-	....	-	ආරක්ෂා කළේ ය.
९. लिखन्ति	-	अलिखन्	-	....
१०. मुञ्चति	- මුදයි.	....	-	....
११. वदति	-	....	-	කීවේ ය.
१२. चिन्तयति	-	अचिन्तयत्	-	....
१३. रचयति	- රචනා කරයි.	....	-	....
१४. पीडयति	-	....	-	පීඩා කළේ ය.
१५. पतावः	- දෙදෙන වැටෙමු.	....	-	දෙදෙන වැටුණෙමු.

නොමිලේ බෙදා හැරීම පිණිසයි

අභ්‍යාසය 5.7

01. ලඞ් ලකාර ආත්මනේපද ක්‍රියා රූපවලින් හිස්තැන් පුරවන්න.

	आत्मनेपद लभ् धातु		
पुरुष	एकवचन	द्विवचन	बहुवचन
प्रथमपुरुष	अलभत		अलभन्त
मध्यमपुरुष		अलभथाम्	
उत्तमपुरुष	अलभे		अलभामहि

आत्मनेपद वृध् धातु		
एकवचन	द्विवचन	बहुवचन
अवर्धत	अवर्धेताम्	
	अवर्धेथाम्	अवर्धध्वम्
अवर्धे		अवर्धामहि

02. ලඞ් ලකාර ආත්මනේපද ක්‍රියාරූපවලින් වාක්‍ය සම්පූර්ණ කරන්න.

१. त्वं बुद्धम् ....। √ वन्द् (ඔබ බුදුන් වැන්දෙහි.)

२. अहं सुभाषितम् ....। √ भाष् (මම යහපත් වචන කීවෙමි.)

३. भक्तः बुद्धम् ....। √ वन्द् (බැතිමතා බුදුන් වැන්දේ ය.)

४. आवां भारम् ....। √ वह् (අපි දෙදෙනා බර ඉසිලුවෙමු.)

५. अध्यापकः छात्रम् ....। √ श्लाग्। (ගුරුවරයා ශිෂ්‍යයා පැසසුවේ ය.)

६. वयं सत्पुरुषान् ....। √ सेव् (අපි සත්පුරුෂයන් ඇසුරු කළෙමු.)

७. युवाम् उपहारम् ....। √ लभ् (ඔබලා දෙදෙනා උපහාර ලැබුවෙහු.)

८. युवां साधून् ....। √ सेव् (නුඹලා සත්පුරුෂයන් ඇසුරු කළෙහු.)

९. सज्जनाः जनान् ....। √ सेव् (සත්පුරුෂයෝ ජනයන් ඇසුරු කළහ.)

१०. याचकौ धनम् ....। √ याच् (යාචකයෝ දෙදෙනා ධනය ඉල්ලුවෝ ය.)

ක්‍රියාකාරකම 5.3

01. සෝපසර්ග ධාතුවලින් සෑදුණු අතීතකාලික ක්‍රියා කිහිපයක් පහත දැක්වේ.
ඒවා හොඳින් අධ්‍යයනය කරන්න.

अति + क्रामति - अतिक्रामति - ඉක්මවායයි > अति + अक्रामत् - अत्यक्रामत् - ඉක්මවාගියේ ය.

अधि + गच्छति - अधिगच्छति - ලබයි > अधि + अगच्छत् - अध्यगच्छत् - ලැබුවේ ය.

अनु + सरति - अनुसरति - ලුහුබඳියි > अनु + असरत् - अन्वसरत् - ලුහුබැන්දේ ය.

अप + नयति - अपनयति - බැහැර ගෙනයයි > अप + अनयत् - अपानयत् - බැහැර ගෙනගියේ ය.

अव + तरति - अवतरति - බසියි > अव + अतरत् - अवातरत् - බැස්සේ ය.

आ + नयति - आनयति - ගෙන එයි > आ + अनयत् - आनयत् - ගෙන ආයේ ය.

उत् + गच्छति - उद्गच्छति - පැන නගියි > उत् + अगच्छत् - उदगच्छत् - පැන නැග්ගේ ය.

उप + गच्छति - उपगच्छति - ළංවෙයි > उप + अगच्छत् - उपागच्छत् - ළංවූයේ ය.

निर् + गच्छति - निर्गच्छति - නික්මෙයි > निर् + अगच्छत् - निरगच्छत् - නික්මුණේ ය.

प्रति + गच्छति - प्रतिगच्छति - වෙතට යයි > प्रति + अगच्छत् - प्रत्यगच्छत् - වෙතට ගියේ ය.

प्र + यच्छति - प्रयच्छति - දෙයි > प्र + अयच्छत् - प्रायच्छत् - දුන්නේ ය.

परा + जयति - पराजयति - පරදියි > परा + अजयत् -पराजयत् - පැරදුණේ ය.

सम् + गच्छति - संगच्छति - එකතු වෙයි > सम् + अगच्छत् -समगच्छत् - එකතු විය.

अनु + भवति - अनुभवति - විඳියි > अनु + अभवत् - अन्वभवत् - වින්දේ ය.

अव + रोहति - अवरोहति - බසියි > अव + अरोहत् - अवारोहत् - බැස්සේ ය

අභ්‍යාසය 5.8

01. පහත දැක්වෙන වාක්‍යවල ඇති හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරන්න. තේරුම ලියන්න.

०१. अहं पोतेन गङ्गां	....	(तरामः / तरामि / तरावः)
०२. कर्षकौ क्षेत्रे बीजानि	....	(वपतः/ वपथः /वपन्ति)
०३. वयं प्रातः बुद्धं	....	(नमामि / नमथः / नमामः)
०४. त्वं देवस्य रूपं	....	(पश्यति / पश्यसि / पश्यामि)
०५. श्रमणाः नूनं सत्यं	....	(वदन्ति / वदतः / वदामः)
०६. सर्पः दारकस्य पादं	....	(दशसि / दशामि / दशति)
०७. यूयं नित्यं सज्जनान्	....	(भजामः / भजथः / भजथ)
०८. गायकौ मधुरं गीतानि	....	(गायतः / गायथः / गायथ)
०९. अग्रजा उद्याने पुष्पाणि	....	(जिघ्रन्ति / जिघ्रति / जिघ्रतः)
१०. वयं सदैव प्रातः गुरून्	....	(अर्चयामः / अर्चयामि / अर्चयावः)
११. पितामहस्य व्याधिः मन्दं	....	(शाम्यतः / शाम्यन्ति / शाम्यति)
१२. सर्पः जलं पातुं गत्वा कूपे	....	(अपतन् / अपतत् / अपतताम्)
१३. अहं गुरुणा सार्धं विहारं	....	(अगच्छम् / अगच्छावः/ अगच्छामः)
१४. श्रावकाः शालायां निषद्य धर्मं	....	(श्रुण्वन्ति / श्रुण्वतः / श्रुण्वत्)
१५. आवां अध्ययनाय पाठालयं	....	(विशावः / विशामः / विशथः)
१६. मृगाः मनुष्यान् दृष्ट्वा शीघ्रं	....	(अधावत् / अधावम् / अधावन्)
१७. युवां पठनेन विना परीक्षणात् समर्थाय कथं	....	(शक्नुथ / शक्नुथः / शक्नुतः)
१८. पूर्वे सर्वज्ञः लङ्कां प्राप्य यक्षेभ्यः धर्मं	....	(अदेशयन् / अदेशयत् /अदेशयताम्)
१९. छात्रः स्व कक्ष्यायां पीठानि च उत्पीठिकाश्च	....	(गणयति / गणयतः / गणयन्ति)
२०. तस्कराः रात्रौ गृहान् प्रविश्य भण्डानि	....	(अमुष्णन् / अमुष्णात्/ अमुष्णीताम्)

ක්‍රියාකාරකම 5.4

01. පහත සඳහන් කථාව හඬනගා සාවධාන ව කියවන්න. තේරුම් ගන්න.

दशमः त्वम् असि ।

शिष्यः विद्यालयं प्रविश्य गुरुं प्रणमति ।

य ප්‍රත්‍යය එකතු වන්නේ උපසර්ග පූර්ව වූ ධාතුවට යි.

- प्र + √ नम् + य > प्रणम्य (වැඳ)
- आ + √ गम् + य > आगम्य (පැමිණ)
- उप + √ कृ + य > उपकृत्य (එළඹ)
- आ + √ कृष् + य > आकृष्य (ඇද)
- प्र + √ विश् + य > प्रविश्य (පිවිස)
- आ + √ नी + य > आनीय (ගෙනවිත්)
- वि + √ हस् + य > विहस्य (සිනාසී)
- वि + √ ज्ञा + य > विज्ञाय (දැන)

මෙම සංවාදය උස් හඬින් කියවන්න.

बालकः - पितः, आम्रफलम् आवश्यकम् ।

प्रदीपः - अस्तु (आपणिकं प्रति) भोः द्वे आम्रफले देहि ।

आपणिकः - स्वीकरोतु श्रीमन् ।

प्रदीपः - भोः एकं फलं नष्टम् अस्ति । एतत् परिवर्त्य अन्यत् देहि ।

(आपणिकः ददाति)

प्रदीपः - धन्यवादः ।

बालकः - अहं फलं खादानि किम् ?

प्रदीपः - खादतु , किन्तु प्रक्षाल्य खादतु । प्रातः उत्थाय दन्तधावनम् अकरोत् वा ?

बालकः - आम् , अकरवम् ।

प्रदीपः - उत्तमम् । इदानीम् भवान् शीघ्रं गृहं प्रति गत्वा किञ्चित् खादित्वा मातुः प्रणम्य स्यूतं स्वीकृत्य आगच्छतु । अहं भवन्तं विद्यालयं प्राप्य कार्यालयं गमिष्यामि ।

(बालकः तानि सर्वाणि कार्याणि कृत्वा आगच्छति ।)

प्रदीपः - पुत्र ! मध्याह्ने विद्यालयात् आगत्य अल्पाहारं च समाप्य एकघण्ठां यावत् उपविश्य पठतु ।

बालकः - अस्तु । तथैव करिष्यामि ।

පහත වාක්‍ය කිහිපය ද විමසුමෙන් බලන්න.

१. अध्यापकः आसन्दे **उपविश्य** प्रश्नं पृच्छति। (उप + √ विश् + य)

२. अर्चकः प्रतिमां **स्थाप्य** पूजां करोति। (सं + √ स्था + य)

३. समाजसेवकः धनं **सङ्गृह्य** समाजसेवां करोति। (सं+ √ गृह् + य)

४. सः माम् **अनुसृत्य** वेगेन आगच्छति। (अनु + √ सृ + य)

५. जननी द्वारम् **उद्घाट्य** अतिथिं सत्करोति। (उत् + √घट् + य)

අභ්‍යාසය 13.2

1. තුමන්ත පද ආශ්‍රයෙන් පහත වාක්‍යය සම්පූර්ණ කර නැවත ලියන්න.

सः	१ पठिष्यति	ग्रन्थालयं	गच्छति।
	२ धनं सम्पादयिष्यति	विदेशं	
	३ क्रेष्यति	आपणं	
	४ खादिष्यति	भोजनालयं	
	५ स्नास्यति	नदीं	
	६ क्रीडिष्यति	क्रीडाङ्गणं	
	७ द्रक्ष्यति	चित्रमन्दिरम्	
	८ उपवेक्ष्यति	उद्यानं	
	९ पास्यति	उपहारगृहं	
	१० लेखिष्यति	प्रकोष्ठं	

අවධානයට

गच्छति	→	गत्वा	(ගොස්)	नयति	→	नीत्वा	(ගෙනගොස්)
आ + गच्छति	→	आगत्य	(පැමිණ)	आ + नयति	→	आनीय	(ගෙනවිත්)
स्मरति	→	स्मृत्वा	(සිහිකොට)	त्यजति	→	त्यक्त्वा	(හැර)
वि + स्मरति	→	विस्मृत्य	(අමතක කොට)	परि + त्यजति	→	परित्यज्य	(අතහැර)

වැරදි	නිවැරදි	අර්ථය
आगत्वा	आगत्य	අවුත්
सङ्गृहित्वा	सङ्गृह्य	රැස්කොට
प्रापयित्वा	प्राप्य	පැමිණ
सम्प्रेषयित्वा	सम्प्रेष्य	සොයාබලා
उपवेषयित्वा	उपवेष्य	එළඹ
आनीत्वा	आनीय	ගෙනවිත්
परिवेषयित्वा	परिवेष्य	පිළිගන්වා
समापयित्वा	समाप्य	නිමාකොට
संस्थापयित्वा	संस्थाप्य	පිහිටුවා
निर्गत्वा	निर्गत्य	නික්ම
विहसित्वा	विहस्य	සිනාසී

අභ්‍යාසය 13.3

1. උදාහරණය ඇසුරෙන් පහත වගුවෙහි හිස්තැන් පුරවන්න.

प्र + क्षालयति	प्रक्षाल्य	සෝදා	परि + वेषयति	....	පිළිගන්වා
आ + गच्छति	....	අවුත්	परि + त्यजति	....	අතහැර
प्र + नमति	....	වැඳ	अभि + नन्दति	....	සතුටු වී
परि + गणयति	परिगण्य	ගණන් කොට	आ + छादयति	आच्छाद्य	සඟවා
वि + गणयति	....	විගණනය කොට	उप + हसति	....	සරදම් කොට
निर् + गच्छति	....	නික්ම	उप + करोति	....	උපකාර කොට
उत् + तिष्ठति	....	නැගිට	प्र + आप्नोति	प्राप्य	පැමිණ
सम् + स्थापयति	....	පිහිටුවා	उद् + धरति	....	ඔසවා
अनु + भवति	....	විඳ	सम् + आप्नोति	....	නිමාකොට
सम् + हरति	....	නිමවා	वि + चारयति	....	විමසා

2. සුදුසු පූර්වක්‍රියා යොදා පහත වාක්‍ය සකසන්න.

१. छात्रः विद्यालयं प्रविष्टवान् । पुस्तकं पठितवान्। — छात्रः विद्यालयं प्रविश्य पुस्तकं पठितवान्।

२. तौ आगमिष्यतः। भोजनं करिष्यतः। ....

३. भिक्षवः उपविशन्ति। ध्यायन्ति। ....

४. त्वं पत्रं लिखसि। प्रेषयसि। ....

५. भवान् सम्बुद्धं प्रणमतु। पठतु। ....

६. वृषभौ शकटम् आकर्षतः। अग्रे नयतः। ....

७. भ्राता पुस्तकम् आनयत् । पाठम् अपठत्। ....

८. सर्वे हस्तान् प्रक्षालयन्तु। भोजनं कुर्वन्तु। ....

९. सिद्धार्थः यशोधरां संस्मरति। प्रसन्नः भवति। ....

१०. आनन्दस्थविरः बुद्धमन्दिरं आगतवान् । संस्कारविधीन् कृतवान्। ....

අභ්‍යාසය 13.4

• උදාහරණයට අනුව පහත වාක්‍ය පූර්වක්‍රියා පද යොදා නැවත ලියන්න.

उदाहरणानि :- सा मोदकं खादति । सा जलं पिबति । सा विद्यालयं गच्छति ।
सा मोदकं खादित्वा जलं पीत्वा विद्यालयं गच्छति ।

१. जननि स्नाति ।ओदनं पचति ।

२. प्रमुखाचार्यः परिवेणं गच्छति । कार्यं करोति ।

३. छात्रः पाठं पठति । निद्राति ।

४. त्वं पत्रं लिखसि । प्रेषयसि ।

५. उपासकः बुद्धं नमति । प्रदक्षिणं करोति ।

६. अध्यापकः पाठं पाठयति । प्रश्नं पृच्छति ।

७. भिक्षुः पात्रं गृह्णाति । पिण्डाय चरति ।

८. मम सहपाठी धर्मं श्रुणोति । धार्मिकः भवति ।

९. रन्दिकः क्षीरं पिबति । शयनं करोति ।

१०. अहं श्लोकं वदामि । अर्थं बोधयामि ।

११. ते चित्रं पश्यन्ति । आनन्दम् अनुभवन्ति ।

१२. सः दुर्गुणं त्यजति । सज्जनः भवति ।

१३. पितामहः धर्मपदं वाचयति । अर्थं वदति ।

१४. जननी पुत्रं ताडयति । दुःखं विन्दति ।

१५. बालिका हसति । संभाषणं करोति ।

උපකාරක පද

නාමපද

1. **श्रीमान्** - ශ්‍රීමතා
2. **शिक्षकः** - ගුරුවරයා
3. **संभाषणशिबिरम्** - සංවාද කඳවුර
4. **दन्तधावनम्** - දත්මැදීම/දත් බුරුසුව
5. **आसन्दः** - පුටුව
6. **अर्चकः** - වදින්නා
7. **ग्रन्थालयः** - පුස්තකාලය
8. **प्रकोष्ठः** - කාමරය
9. **उपहारगृहम्** - අවන්හල
10. **संस्कारविधिः** - පිළිවෙත
11. **प्रमुखाचार्यः** - පරිවෙණාධිපති/විදුහල්පති

ක්‍රියාපද

1. **अर्हति** - සුදුසු වෙයි
2. **अत्ति** - කයි
3. **स्वीकरोति** - පිළිගනියි
4. **नष्टम्** - නැසුණු
5. **धन्यवादः** - ස්තුතියි
6. **अनुसरति** - ලුහුබඳියි
7. **उद्घाटयति** - විවෘත කරයි
8. **ध्यायति** - භාවනා කරයි
9. **आकर्षति** - අදියි
10. **निद्राति** - නිදයි

यत्ने कृते यदि न सिध्यति कोऽत्र दोषः।
යත්නේ කෘතේ යදි න සිධ්‍යති කෝ'ත්‍ර දෝෂඃ
උත්සාහ කළවිටත් අපේක්ෂා ඉටුනොවේ නම් එහි වරද කිම?

यथा बीजं तथाङ्कुरः।
යථා බීජං තථාඞ්කුරඃ
බීජය යම්සේ ද අඞ්කුරය එසේ ය.

यथौषधं स्वादुहितं च दुर्लभम्।
යථෞෂධං ස්වාදුහිතං ච දුර්ලභම්.
මිහිරි සහ හිතකර බෙහෙත් දුර්ලභ ය.

14
පාඩම
चतुर्दशः पाठः।

अवश्यं लभते कर्ता फलं पापस्य कर्मणः।

(පව්කරන්නා පවෙහි ඵල ලබයි.)

कृदन्त परिचयः। २

සෝපපද හෝ අනුපපද ධාතුවකට තුන්කාලය හැඟවෙන විවිධ ප්‍රත්‍යයන් යෙදීමෙන් සාදාගනු ලබන පද **ත්‍රෛකාලික කෘදන්ත** යනුවෙන් හඳුන්වනු ලැබේ. කර්තෘ යනු කරන්නා යි. මෙය √ **කෘ** ධාතුව කෙරෙන් කර්තෘ අර්ථයෙහි **තෘ ප්‍රත්‍ය** යෙදීමෙන් සෑදුණු පදයකි. **තෘ** ප්‍රත්‍යය කාලත්‍රයවාචී ය. අතීත, වර්තමාන සහ අනාගත යන තුන් කාලයෙහි ම කරන තැනැත්තා ඒ නාමයෙන් හැඳින්වේ.

कर्तृ - කරන්නා	दातृ - දෙන්නා	पक्तृ - පිසන්නා

සෝපපද ධාතුවකට ප්‍රත්‍යය එකතුවීම (ධාතුවකට පෙර උපපද යෙදීම)

कवच + √ हृ + अ → कवचहरः (සන්නාහය ගෙනයන්නා)
धनुस् + √ धृ + अ → धनुर्धरः (දුනු දරන්නා)

අනුපපද ධාතුවකට ප්‍රත්‍යය එකතුවීම (ධාතුවකට පසු උපපද යෙදීම)

√ ऋज् + अक → अर्जकः (රැස්කරන්නා)
√ बुध् + क → बुधः (නැණවතා)

ත්‍රෛකාලික කෘදන්ත ප්‍රත්‍යය විසි හතරක් පවතින අතර ඒවා පහත දැක්වේ.

तृच्	अक	क	अ	अन	णिनि
श	ण	ड	ट	इ	ख
खि	खश्	ख्युट्	च्वि	डाच्	टक्
विण्	मनिप्	क्वनिप्	वनिप्	क्विप्	केलिम

කර්තෘවාචක ''කෘත්'' ප්‍රත්‍යයෝ

तृच् ප්‍රත්‍යය (මෙහි '' च् ''යන්න ඉත් අකුරකි. එය පද සාධනයේ දී ඉවත් වේ.)

ධාතුව	කෘත් ප්‍රත්‍යය	කෘදන්ත පදය	ප්‍රථමා ඒකවචන	අර්ථය
कृ	तृ	कर्तृ	कर्ता	කරන්නා
दा	तृ	दातृ	दाता	දෙන්නා
नी	तृ	नेतृ	नेता	මග කියන්නා
हृ	तृ	हर्तृ	हर्ता	හරින්නා
जी	तृ	जेतृ	जेता	දිනන්නා
मृ	तृ	मातृ	माता	මනින්නා
एध	तृ	एधितृ	एधिता	වැඩෙන්නා
भू	तृ	भवितृ	भविता	වන්නා
रु	तृ	रवितृ	रविता	හඬන්නා

अच् ප්‍රත්‍යය

पचति इति पचः
गिरौ शेते इति गिरिशः

ධාතුව	ප්‍රත්‍යය	කෘදන්ත නාමය	අර්ථය
वच्	अ	वचः	කියන්නා
पच्	अ	पचः	පිසන්නා
क्षम्	अ	क्षेमः	ඉවසන්නා
नद्	अ	नदः	හඬන්නා
चल्	अ	चलः	සැලෙන්නා
दिव्	अ	देवः	බැබළෙන්නා
धृ	अ	धरः	දරන්නා
सृप्	अ	सर्पः	ඇදී වක් ව යන්නා
कृश्	अ	कृशः	කෘශ පුද්ගලයා
चुर्	अ	चोरः	සොරාගන්නා

සෝපපද ධාතුන්ට "අ" ප්‍රත්‍යය යෙදීම.

සෝපපද ධාතුව	ප්‍රත්‍යය	කෘදන්ත නාමය	අර්ථය
यशस् + कृ	अ	यशस्करः	කීර්තිය උපදවන්නා
भार + वह्	अ	भारवहः	බර උසුලන්නා
सम् + वद्	अ	संवदः	යහපත පවසන්නා
पुरस् + सृ	अ	पुरस्सरः	ඉදිරියෙහි ගමන් ගන්නා

ण्वुल् / अक प्रत्‍यय

මෙහි ප්‍රත්‍යය වන්නේ **ण्वुल्** යන්නයි. **अक** යනු ආදේශය යි. **ण्** යෙදී ඇත්තේ වෘද්ධිවීම පිණිස යි.

नी + अक → नायक
कृ + अक → कारक
ध्यै + अक → ध्यायक

ධාතුව	ප්‍රත්‍යය	කෘදන්ත නාමය	ප්‍රථමා ඒක වචනය	අර්ථය
वच्	अक	वाचक	वाचकः	කියන්නා හෝ කියවන්නා
पच्	अक	पाचक	पाचकः	පිසන්නා හෝ පිසවන්නා
पठ्	अक	पाठक	पाठकः	හදාරන්නා හෝ හදාරවන්නා
यच्	अक	याचक	याचकः	ඉල්ලන්නා හෝ ඉල්ලවන්නා
चल्	अक	चालक	चालकः	සැලෙන්නා හෝ සැලවන්නා
दा	अक	दायक	दायकः	දෙන්නා හෝ දෙවන්නා
नृत्	अक	नर्तकः	नर्तकः	නටන්නා හෝ නටවන්නා
श्रु	अक	श्रावक	श्रावकः	අසන්නා හෝ අස්වන්නා
सेव्	अक	सेवकः	सेवकः	සේවය කරන්නා හෝ සේවය කරවන්නා

णिनि / इन् ප්‍රත්‍යය

මෙම ප්‍රත්‍යයේ ශේෂ වන්නේ **इन्** යන්න පමණකි.

ग्राहिन्
करिन्
भाविन्

ධාතුව	ප්‍රත්‍යය	කෘදන්ත නාමය	ප්‍රථමා ඒක වචනය
वद्	इन्	वादिन्	वादी
ग्रह्	इन्	ग्राहिन्	ग्राही
स्था	इन्	स्थायिन्	स्थायी
मन्त्र	इन्	मन्त्रिन्	मन्त्री
उद् + सह्	इन्	उत्साहिन्	उत्साही
द्रुह्	इन्	द्रोहिन्	द्रोही
नि + वस्	इन्	निवासिन्	निवासी
अप + राध्	इन्	अपराधिन्	अपराधी
नि + रक्ष	इन्	निरक्षिन्	निरक्षी
पण्डित + मन्	इन्	पण्डितमानिन्	मण्डितमानी

क ප්‍රත්‍යය

සුබන්ත හා උපසර්ගවලින් පර ව සිටි අකාරාන්ත ධාතුන්ගෙන් පසු ව ''ක'' ප්‍රත්‍යය යෙදේ. එම ''ක'' ප්‍රත්‍යයේ ''ක්'' යන්න ලොප් වී ''අ'' පමණක් ඉතිරි වේ. එබැවින් මෙහි ශුද්ධ ප්‍රත්‍යය වන්නේ ''අ'' යන්න යි.

जलं ददाति (जल + दा + क) ⟶ जलदः
मधु पिबति (मधु + पा + क) ⟶ मधुपः

ධාතුන්ගේ අවසන් අකුරට ප්‍රථමයෙන් ඉ, උ හෝ ඍ අකුරක් සිටි විට ද කර්තෘ අර්ථයෙහි ක වේ.

बुध् + क ⟶ बुधः

පහත වගුවෙහි ඇති නිදර්ශන දෙස අවධානය යොමු කරන්න.

ධාතුව	ප්‍රත්‍යය	කෘදන්ත නාමය	අර්ථය
विद्	अ	विदः	දන්නා පුද්ගලයා
छिद्	अ	छिदः	ඡේද කරන්නා
क्षिप्	अ	क्षिपः	මෙහෙයවන්නා
भूमि + दा	अ	भूमिदः	භූමිය දෙන්නා
जल + दा	अ	जलदः	ජලය දෙන්නා
मध्य + स्था	अ	मध्यस्थः	මැදහත් තැනැත්තා

अन ප්‍රත්‍යය

ධාතුව	ප්‍රත්‍යය	කෘදන්ත නාමය
शुभ्	अन	शोभन
नन्द्	अन	नन्दन
छिद्	अन	छेदन
रम्	अन	रमण
साध्	अन	साधन
वृध्	अन	वर्धन
ज्वल्	अन	ज्वलन
सह्	अन	सहन
ज्ञा	अन	ज्ञान
पा	अन	पान
नृत्	अन	नर्तन

අභ්‍යාසය 14.1

01. පහත පද්‍යයන්හි ඇති කෘදන්ත පද උපුටා ඒවා සෑදෙන අයුරු දක්වන්න.

चरिता शुभकार्याणां लभते यश उत्तमम्।
वक्तासत्यस्य वाक्यस्य दुःखं न खलु विन्दते॥
स्वयंवोढा हि भारस्य सर्वदा सुखभाग् भवेत्।
विस्मर्तागुरुवाक्यानां न कदापि सुखी भवेत्॥

न्यायकारी मन्दगामी सत्यवादी न प्राप्य तै।
उपकारी सदाचारी मिष्टभाषी च दुर्लभः॥
धनहारी स्तेयजीवी नरकं याति मानवः।
दुराचारी शुभाचारी लभते वाच्यतां सदा॥

02. ඔබ උගත් ත්‍රෛකාලික කෘදන්ත ප්‍රත්‍යයන්ගෙන් සෑදී ඇති වෙනත් පද පාඨ ග්‍රන්ථයන්ගෙන් උපුටා දක්වන්න.
03. ත්‍රෛකාලික කෘදන්තපද සාදා ගන්නා අයුරු පැහැදිලි කරන්න.
04. **තෘ, අක, ක,** අ ප්‍රත්‍යවලින් නිර්මාණය වන වෙනත් කෘදන්ත පද තුන බැගින් සොයා ලියන්න.
05. (අ) පහත වාක්‍ය සිංහලයට නගන්න.
(ආ) වාක්‍යයන්හි යෙදී ඇති කෘදන්ත රූප තෝරා ඒවායෙහි ධාතු දක්වන්න.

१. नित्यमेव मधुरान्नानि खादकाः अस्वस्थाः भवन्ति।
२. गायकः रुचिरं गीतं गायति।
३. प्रेक्षकाः सुन्दराणि चित्राणि पश्यन्ति।
४. सर्वे पाठकाः श्रेष्ठपुस्तकानि पठन्तु।
५. पाचकः मिष्टं भोजनं ददाति।
६. राष्ट्रस्य रक्षकः माननीयः भवति।
८. कर्षकाः वर्षासु धान्यं वपन्ति।
९. विद्यायाः प्रचारकाः प्रशंसनीयाः भवन्ति।
१०. शासकः जनतायाः करं गृह्णाति।

නොමිලේ බෙදා හැරීම පිණිසයි

06. (අ) පහත වාක්‍ය සිංහලයට නගන්න.

(ආ) වාක්‍යයන්හි යෙදී ඇති කෘදන්ත රූප තෝරා ඒවායෙහි ධාතු දක්වන්න.

०१. धर्मस्य श्रोतारः अल्पाः एव भवन्ति ।

०२. धनस्य दाता उदारः कथ्यते ।

०३. परकार्यस्य रोद्धा निन्दितः भवति ।

०४. सत्पथे गन्ता प्रशंसनीयः भवति ।

०५. युद्धे जेता ऐश्वर्यं लभते ।

०६. व्याकरणस्य ज्ञाता वैयाकरणः कथ्यते ।

०७. तथ्यस्य वक्तारः दुर्लभाः भवन्ति ।

०८. सत्कार्यस्य कर्तारः प्रशंसनीयाः भवन्ति ।

याज्ञा मोघा वरमधिगुणो नाधमे लब्धकामा ।

යාඥා මෝඝා වරමධිගුණෝ නාධමේ ලබ්ධකාමා.

උතුමකුගෙන් තමා කළ ඉල්ලීම නොලැබුණත් කම් නැත.

අධමයකුගෙන් ලැබීම යහපත් නොවේ.

रिक्तः सर्वो भवति हि लघुः पूर्णता गौरवाय ।

රික්තඃ සර්වෝ භවති හි ලඝුඃ පූර්ණතා ගෞරවාය.

හිස් සියල්ල සැහැල්ලු ය. පිරුණ බව ගෞරවය පිණිස හේතු වේ.

वरं मौनं कार्यं न च वचनमुक्तं यदनृतम् ।

වරං මෞනං කාර්යං න ච වචනමුක්තං යදනෘතම්.

කියන ලද බොරු වදන්වලට වඩා නිශ්ශබ්ද ව සිටීම උතුම් ය.

15
පාඩම
पञ्चदशः पाठः ।

कथं कदा कुत्र गच्छति ?

(කෙලෙස කෙදිනක කොතන යන්න ද?)

वाक्य निर्माण परिचयः । १

कथं कदा कियत् कुत्र - किमर्थं किं करोम्यहम् ।
कस्यार्थे च कया शक्त्या - चिन्तयेयं मुहुर्मुहुः ॥

කෙසේ කවදා කොහේදෝ මම කුමක් කොපමණ කරන්නේ
කුමන ශක්තියකින් ද මොහොතක් කිම ද අර්ථය සිතන්නේ

අභ්‍යාසය 15.1

- වගුවල දක්වා ඇති රටාවන් අධ්‍යයනය කර, අර්ථවත් වාක්‍ය තනා ලියන්න.

सः	कथं	खादति ?
	आनन्देन / लोभेन / लज्जया / शान्त्या त्वरया / शीघ्रं / मन्दं मन्दं	

सः	किं	खादति ?
	ओदनं / मांसं / पयोहिमं / फलं / रसगोलं / सेवाफलं आम्रफलं / दालिं / जम्बीरं / कदलीफलं	

सः	कुत्र	खादति ?
	भोजनालये / गृहे / बन्धुगृहे / आश्रमे नेवासिकागारे / वृक्षमूले / नदीतले	

නොමිලේ බෙදා හැරීම පිණිසයි

सः	कदा प्रभाते / सप्तवादने / मध्याह्ने / अपराह्ने रात्रौ / चतुर्वादने / पञ्चवादनात् पूर्वं	खादति ?
सः	किमर्थं शक्तिलाभार्थं / जीवनधारणार्थं स्वास्थ्यलाभार्थं / क्षुधानिवारणं	खादति ?
सः	कथं शुद्धं / अशुद्धं / स्पष्टं / अस्पष्टं ध्यानपूर्वकं / वारंवारं / तूष्णीं	पठति ?
सः	किं सस्कृतं / मातृभाषां / गणितं / भूगोलं इतिहासं / आङ्गलभाषां	पठति ?

ක්‍රියාපදයක් තනනු ලබන්නේ ධාතුවකට විවිධ ප්‍රත්‍යය එකතු කිරීමෙනි. ක්‍රියාපදයක මුල් අවස්ථාව ධාතුව නම් වේ. සංස්කෘත භාෂාවේ ධාතු 2000කට අධික ප්‍රමාණයක් පවතී. ඒවායෙහි සුවිශේෂ වෙනස්කම් මත ඒවා පොදුවේ කොටස් දහයකට බෙදා ඇත. දශධාතු ගණ වශයෙන් එම කොටස් හැඳින්වේ.

උදා :- පඨති යනු ක්‍රියාපදයකි. මෙහි ධාතුව 'පඨ්' යන්න යි.
ධාවති - ධාව්, බාදති - බාද්, හසති - හස්

नमति ।	- (වදියි)	गच्छति ।	- (යයි)
हसति ।	- (සිනාසෙයි)	लिखति ।	- (ලියයි)

खादति ।	- (කයි)	**पिबति ।**	- (බොයි)
पूजयति ।	- (පුදයි)	**क्रीडति ।**	- (සෙල්ලම් කරයි)
पठति ।	- (කියයි)	**विशति ।**	- (පිවිසෙයි)

යනු ක්‍රියාපද කිහිපයකි.

ක්‍රියාකාරකම 15.1

ඉහත ක්‍රියාපදවල අග ඇති '**ति**' ප්‍රත්‍යය සියල්ලට ම පොදු වේ. එම '**ति**' ප්‍රත්‍යය ඉවත් කරමු. එවිට ක්‍රියාපදයෙහි තේරුම වෙනස් වේ. **धावति** යනු දුවයි යන්න යි. එහෙත් **धाव** යනු දුවන්න යන්න යි. එය විධාන ක්‍රියාවකි.

උදා :- **धावति** > **धाव** + ~~ति~~ > **धाव** - දුවන්න

नमति	**गच्छति**	**हसति**	**लिखति**	**खादति**
पिबति	**पूजयति**	**क्रीडति**	**पठति**	**विशति**

අභ්‍යාසය 15.2

- පහත සඳහන් ක්‍රියාපද සංස්කෘතයට නගන්න.

1. යන්න	....	2. සිනාසෙන්න	....
3. ලියන්න	....	4. කන්න	....
5. බොන්න	....	6. පුදන්න	....
7. සෙල්ලම් කරන්න	....	8. පාඩම් කරන්න	....
9. පිවිසෙන්න	....	10. උයන්න	....

'ති' ප්‍රත්‍යය ඉවත් වූ පසු ශේෂ වන කොටසට **मा** යන නිපාතය එකතු කරමු. **मा** යන්නෙහි තේරුම 'එපා' යන්නයි.

උදා :- දුවන්න එපා. **मा धाव ।**

නොමිලේ බෙදා හැරීම පිණිසයි

අභ්‍යාසය 15.3

1. පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයටත් සිංහල වාක්‍ය සංස්කෘතයටත් නගන්න.

१. मा क्रीड ।	....	1. ලියන්න එපා	....
२. मा पूजय ।	....	2. කන්න එපා	....
३. मा लिख ।	....	3. කියන්න එපා	....
४. मा पिब ।	....	4. සිනාසෙන්න එපා	....
५. मा पठ ।	....	5. යන්න එපා	....

2. **वसति / अटति / चरति / हरति / नयति / भवति / चलति / यच्छति**

මේ ක්‍රියාපදයන්ට සුදුසු පරිදි **मा** නිපාතය යොදන්න.

වාක්‍යයක කර්මපදයට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. කර්තෘගේ ක්‍රියාවට අනුගත පදය කර්මපදය වේ. කර්තෘකාරක වාක්‍යක කර්මපදය ද්විතීයා විභක්තියෙන් තැබේ. එහි ප්‍රධාන අදියර දෙකකි.

- ඍජුව ම කර්තෘගේ ක්‍රියාවට යටත් වන පදය ද්විතීයා විභක්තියෙන් තැබීම.

सः / सा / बालकः / बालिका / नरः पुरुषः / छात्रः / मुनिः / गुरुः	किम्	खादति ?
	अन्नम् / फलम् / आम्रफलम् सेवाफलम् / द्राक्षम् / कदलीफलम् ओदनम् / मांसम् / पयोहिमम् / अपूपम्	

උදා :- **सा किं खादति ?**

ඇය කන්නේ මොනවා ද?

सा सेवाफलं खादति ।

ඇය ඇපල් ගෙඩියක් කයි.

ක්‍රියාකාරකම 15.2

1. උදාහරණයට අනුව අර්ථවත් වාක්‍ය 10ක් නිර්මාණය කරන්න.

ते / बालिकाः / शिशवः / गुरवः मुनयः / भूपतयः / बालकाः	किम्	खादन्ति ?
	अन्नम् / फलम् / आम्रफलम् / सेवाफलम् द्राक्षम् / कदलीफलम् / ओदनम् मांसम् / पयोहिमम् / अपूपम्	

උදා :- ते किं खादन्ति ? — ඔවුහු කුමක් කත් ද? / ඔවුහු කන්නේ මොනවා ද?

ते सेवाफलं खादन्ति । — ඔවුහු ඇපල් ගෙඩියක් කති.

2. උදාහරණයට අනුව ඉහත වගුව යොදා ගනිමින් අර්ථවත් වාක්‍ය 10ක් නිර්මාණය කරන්න.

- යම් ස්ථානයකට ගමන් කරන්නේ නම් එම ස්ථානය ද ද්විතීයා විභක්තියෙන් තැබිය යුතු ය.

सः / सा / बालकः / बालिका / नरः पुरुषः / छात्रा / मुनिः / गुरुः	कुत्र	गच्छति ?
ते / बालिकाः / शिशवः / गुरवः मुनयः / भूपतयः / बालकाः		गच्छन्ति ?
	गृहम् / पाठालयम् / ग्रामम् / आश्रमम् क्रीडांगणम् / कार्यालयम् / विद्यालयम् आपणम् / सभाम् / पुस्तकालयम् पत्रालयम्	

උදා :- सः कुत्र गच्छति ? — ඔහු කොහේ යයි ද? / ඔහු කොහෙ ද යන්නේ ?

सः कार्यालयं गच्छति । — ඔහු කන්තෝරුවට යයි.

ते कुत्र गच्छन्ति ? — ඔවුහු කොහේ යත් ද ? / ඔවුන් කොහෙ ද යන්නේ ?

ते कार्यालयं गच्छन्ति । — ඔවුහු කන්තෝරුවට යති.

නොමිලේ බෙදා හැරීම පිණිසයි

3. උදාහරණවලට අනුව ඉහත වගුව යොදාගනිමින් අර්ථවත් වාක්‍යය 10ක් නිර්මාණය කරන්න.

නාමපදයක් ප්‍රධාන වශයෙන් අදියර හතකට වර්ග කෙරේ. එහි තුන්වන අවස්ථාව තෘතීයා විභක්ති ලෙස හැඳින්වේ. කර්තෘගේ ක්‍රියාවට සහයෝගය දක්වන පද මේ තෘතීයා විභක්තියෙන් තැබේ.

උදා :- **त्वं केन आगच्छसि ?** නුඹ කොහොම ද එන්නේ ?

अहं शकटेन आगच्छामि । මම කරත්තයෙන් එමි.

මෙහි පැමිණීම සඳහා කර්තෘට සහයෝගය දක්වා ඇත. " **शकटेन** " පදය තෘතීයා විභක්තියෙන් තබා ඇත.

सः (केन) गच्छति ?

शकटेन - सर्वयानेन
धूमयानेन - गगनयानेन - द्विचक्रेण

අභ්‍යාසය 15.4

1. පහත සඳහන් වචනවල සිංහල අර්ථ ලියන්න.

१. हस्तेन - ....

२. नेत्रेण - ....

३. गानेन - ....

४. चषकेन - ....

५. फरसुना - ....

६. नेत्राभ्याम् - ....

७. पादाभ्याम् - ....

८. सर्वयानैः - ....

९. हस्ताभ्याम् - ....

१०. पुष्पैः - ....

2. පහත සඳහන් වාක්‍ය ඛණ්ඩ සංස්කෘතයට නගන්න.

01. අතින් ලියයි.
02. බස් එකෙන් පැමිණෙයි.
03. දෑසින් බලයි.
04. කෝප්පයෙන් බොයි.
05. සිදුරෙන් බලයි.
06. පිහියෙන් කපයි.
07. දෑතින් ඔසවයි.
08. දිවෙන් රස විඳියි
09. කසයෙන් ගසයි.
10. රෝද දෙකින් පදවයි.

ක්‍රියාකාරකම 15.3

तव नाम किम् ?	(ඔබේ නම කුමක් ද?)
मम नाम कालिदासः ।	(මගේ නම කාලිදාස)
तस्य नाम किम् ?	(ඔහුගේ නම කුමක් ද?)
तस्याः ग्रामः कुत्र ?	(ඇගේ ගම කොහේ ද?)

යනාදි පරිදි මගේ, අපගේ, ඔහුගේ, ගොවියාගේ ආදි නයින් අයිතියක් පිළිබඳ සාකච්ඡා කෙරේ නම්, එම පද ෂෂ්ඨී විභක්තියෙන් තැබේ.

උදා :- एषः मम निचोलः ।
अस्माकं देशं रक्षणीयम् ।
खगस्य पत्रे स्तः ।
तव स्यूतः कुत्र अस्ति ?
मातुः गानेन तुष्यते ।
नद्याः जलेन कर्षति ।

අභ්‍යාසය 15.5

1. සංස්කෘත භාෂාවෙන් ම පිළිතුරු සපයන්න.

१. तव नाम किम् ?

२. तव ग्रामः कुत्र अस्ति ?

३. तव पिता कुत्र कार्यं करोति ?

४. तव माता किं करोति ?

५. तव स्वसुः विद्यालयः कः ?

६. तव प्रियतमं विषयं किम् ?

७. तव प्रियम् अन्नं किम् ?

८. तव प्रियतमं फलं किम् ?

९. तव सङ्केतं किम् ?

१०. तव जन्मदिनं कदा ?

2. සිංහලයට නගන්න.

१. एषा मम सखी।

२. एषः मम आदेशः।

३. मम गृहसंकतः।

४. सः मम छात्रः।

५. सः मम दोषः न।

६. मम वचनं श्रुणु।

७. मम तु आक्षेपं नास्ति।

८. मद्दृशः एव मम पुत्रः।

९. मम शिरः भ्रमति एव।

१०. मम दूरभाषसंख्यां जानाति वा ?

3. පහත වගුව ඇසුරෙන් වාක්‍ය තනා සිංහලයට පරිවර්තනය කරන්න.

तस्य / तस्याः / मम / तव आचार्यस्य / साधोः / मुनेः / पितुः	आज्ञा	अनुसरति
तयोः / आवयोः / युवयोः / आचार्ययोः साध्वोः / मुन्योः / पित्रोः	इच्छां	फलति / समाप्नोति
तेषां / तासां / अस्माकं / युष्माकं आचार्याणां / साधूनां / मुनीनां / पितृणां	समाचारः	अनुगच्छ

අභ්‍යාසය 15.6

कुत्र + अपि - (කොහේවත්)

1. සිංහලයට නගන්න.

१. कुत्रापि मा गच्छ । ....

२. कुत्रापि तया सह मा तिष्ट । ....

३. कुत्रापि तेन सह मा गच्छ । ....

४. कुत्रापि केवलं मा भ्रम । ....

५. कुत्रापि मां त्यज्य मा गच्छ । ....

किञ्चित् + अपि - (මොකවත්)

2. සංස්කෘතයට නගන්න.

1. මොකවත් බොන්න එපා. ....

2. මොකවත් දෙන්න එපා. ....

3. මොකවත් හොරෙන් ගන්න එපා. ....

4. මොකවත් ඔහුට කියන්න එපා. ....

5. මොකවත් කළුලෑල්ලේ ලියන්න එපා. ....

कथम् + अपि - (කොහොමහරි)

3. සිංහලයට නගන්න.

१. कथमपि मां मा विस्मर । ....

२. कथमपि वार्तापत्रिका आनय । ....

३. कथमपि समये तत्र गच्छत । ....

४. कथमपि तं चोरं गृहाण । ....

५. कथमपि संस्कृतं सम्यग् पठत । ....

कदा + अपि - (කවදාවත්)

4. සිංහලයට නගන්න.

१. कदापि पुनः तत्र मा गच्छ । ....

२. कदापि केवलं असत्यं मा वद । ....

३. कदापि तया सह मा सञ्चर । ....

४. कदापि तथा मा कुरु । ....

५. कदापि मातापितरं मा विस्मर । ....

අභ්‍යාසය 15.7

1. कुत्रापि - किञ्चिदपि - कथमपि - कदापि
   යන ප්‍රශ්නවාචී පද යොදා වාක්‍ය 10 ක් නිර්මාණය කරන්න.

कदा - यदा - तदा - सर्वदा - सदा - एकदा

යන පදයන්හි යෙදෙන दा ප්‍රත්‍යය කාලාර්ථය හඟවයි.

උදා :- **कदा त्वं प्रभाते उत्तिष्ठसि ?** කීයට ද ඔබ උදේ නැගිටින්නේ ?

2. සිංහලයට නගන්න.

१. कदा सा प्रातरासं खादति ? ....

२. कदा तव जन्मदिनम् ? ....

३. कदा पिता कार्यालयं गच्छति ? ....

४. कदा नक्षत्राणि प्रकाशन्ते ? ....

५. कदा दन्तधावनं करोषि ? ....

किमर्थम् - (ඇයි)

උදා :- ඇයි පමා වෙන්නේ ? — **किमर्थं विलम्बः ?**

ඇයි එහෙම කියන්නේ ? — **तथा किमर्थं वदति ?**

3. සිංහලයට නගන්න.

१. अहं किमर्थम् असत्यं वदामि ?
२. विना कारणं किमर्थं रोदिसि ?
३. शुनकः किमर्थम् इत्थं भषति ?
४. किमर्थम् इति पृच्छति चेत् भवान् कुप्यति ?
५. संस्कृतेन सम्भाषणं कर्तुं किमर्थं सङ्कोचः ?
६. किमर्थम् अद्य विद्यालयं न गच्छन्ति ?
७. किमर्थं तथा मां पश्यति ?
८. किमर्थम् एवं तां परित्यज्य प्रवासं गमिष्यसि ?
९. किमर्थम् असत्यं वदसि ? सत्यं मा गूही ।
१०. तया सार्धं तत्र किमर्थं पठसि ?

4. සංස්කෘතයට නගන්න.

1. ඇයි මොකුත් කන්නෙ නැත්තෙ ? ....
2. ඇයි කට අරින්නෙ නැත්තෙ ? ....
3. ඇයි ඉක්මනින් කෝපවෙන්නෙ ? ....
4. ඇයි එහෙ යන්න කැමති නැත්තෙ ? ....
5. ඇයි ඔහොම කරන්නෙ ? ....
6. ඇයි කවුරුවත් එන්නෙ නැත්තෙ ? ....
7. ඇයි නිහඬ ව ඉන්නෙ ? ඇතුළට එන්න. ....
8. ඇයි අම්මා අපිත් එක්ක කථා නැත්තෙ ? ....
9. ඇයි ඇය එහෙම ඔබට කියන්නෙ ? ....
10. ඇයි කලින් අභ්‍යාස නොකරන්නෙ ? ....

අභ්‍යාසය 15.8

1. සිංහලයට නගන්න.

१. कोऽपि केन सह तत्र वसति ?
२. के अद्य विद्यालयं न आगतवन्तः किल ?
३. कः नित्यमेव कया सार्धं भ्रमति ?
४. कस्मिन् ग्रामे ते प्रतिवसन्ति ?
५. कैः सह क्रीडन्ति सायं तत्र ?
६. कस्मै वस्त्रम् अन्नं च ददाति ?
७. केभ्यः नगरेभ्यः करः चिनोति ?
८. कस्य माता विहारमहादेवी किल ?
९. केषु स्नेहं प्रदर्शयसि ?
१०.काभिः सह ते कस्मिन् वने कान् मृगान् व्यापादयन्ति ?

ක්‍රියාකාරකම 15.4

- පහත සඳහන් ප්‍රශ්නවලට පන්තියේ යහළුවන්ගෙන් පිළිතුරු අසා ලියන්න.

१. तव नाम किम् ?

२. का तव माता ?

३. भवत्याः नाम किम् ?

४. तव पितुः नाम किम् ?

५. किम् - माता गृहे एव वसति ?

६. अपि - पिता कुत्र सेवां करोति ?

७. कति सदस्याः गृहे प्रतिवसन्ति ?

८. तव अग्रजः कः इति वदतु ?

९. तव पितामहस्य नाम किम् ? सः कुत्र केन सह वसति ?

१०. स्वसा किं करोति ? अनुजः कुत्र पठति ?

११. ते कस्मिन् वर्गे कानि कानि पठन्ति ?

१२. तव प्रियतमः भाषा का ?

१३. तव मातुः प्रियतमः अन्नं किम् ?

१४. आगामि सप्ताहे कुत्र गमिष्यसि ?

१५. कदा त्वं प्रभाते उत्तिष्ठसि ?

१६. कदा केन सह प्रातरासं भुञ्जति ?

१७. सायं कदा पूजां करोति ?

१८. लङ्कायां कुत्र कुत्र गन्तुम् इच्छसि ?

१९. कस्मिन् स्नेहं श्रद्धा वा अस्ति ?

२०. अनागते कः भवितुम् इच्छसि ?

පුනරීක්ෂණ

අලුත් වාක්‍යය තනමු.

सः - सा - बालकः - कविः - गुरुः	इतिहासं गणितं आङ्गलभाषां संस्कृतभाषां महाभारतं पञ्चतन्त्रं	पठति ।
त्वम्		पठतः ।
अहम्		पठन्ति ।
तौ - बालकौ - कवी - गुरू		पठसि ।
युवाम्		पठथः ।
आवाम्		पठथ ।
ते - बालकाः - कवयः - गुरवः		पठामि ।
यूयम्		पठावः ।
वयम्		पठामः ।

सः - सा - बालकः - कपिः - गुरुः	न - नित्यम् - बहु - स्वादु अन्नम् - अल्पम् अत्यल्पम् - उदरपूरम् - सामिषम् निरामिषम् - किमपि - मन्दं मन्दम् सन्तोषेण - बहुकालम् - त्वरया - शनैः शनैः	खादति
त्वम्		खादतः
अहम्		खादन्ति
तौ - बालकौ - कपी - गुरू		खादसि
युवाम्		खादथः
आवाम्		खादथ
ते - बालकाः - कपयः - गुरवः		खादामि
यूयम्		खादावः
वयम्		खादामः

උපකාරක පද

නාමපද

1. **त्वरया** - ඉක්මනින්
2. **पयोहितम्** - අයිස්ක්‍රීම් (හිමකිරම)
3. **रसगोलम्** - අග්ගලා
4. **दालिं** - ධාන්‍ය
5. **जम्बीरम्** - ජම්බෝල / සිදරන්

ක්‍රියාපද

1. **चालयति** - පදවයි
2. **लुनाति** - කපයි
3. **आमृषति** - විඳියි
4. **गूहति** - සඟවයි

6. स्पष्टम् - නිරෝගී බව
7. आङ्गलभाषा - ඉංග්‍රීසි භාෂාව
8. पत्रालयम् - තැපැල් කන්තෝරුව
9. छूरिका - පිහිය
10. सर्वयानम् - බසය
11. छिद्रः - සිදුර
12. निचोलः - අඳනය
13. स्यूतः - මල්ල
14. सखी - යෙහෙළිය
15. आक्षेपम् - දොස්කීම
16. वार्तापत्रिका - පුවත්පත
17. कृष्णफलकम् - කළුලෑල්ල
18. प्रवासः - සංචාරය
19. करः - අයබදු
20. भवत्याः - ඔබතුමියගේ
21. सदस्याः - සාමාජිකයෝ
22. आगामि सप्ताहे - ලබන සතියේ

पङ्को हि नभसि क्षिप्तः क्षेप्तुः पतति मूर्धनि ।
පඞ්කෝ හි නභසි ක්‍ෂිප්තඃ ක්‍ෂේප්තුඃ පතති මූර්ධනි
උඩට දමන ලද මඩ එය දැමූවහුගේ හිස මත වැටේ.

पयः पानं भुजङ्गानां केवलं विषवर्धनम् ।
පයඃ පානං භුජඞ්ගානාං කේවලං විෂවර්ධනම්
කිරිබීම සර්පයන්ගේ විෂ වැඩීම පිණිස පමණක් හේතු වේ.

पयो गते किं खलु सेतुबन्धः ।
පයෝ ගතේ කිං ඛලු සේතුබන්ධඃ
ජලය බැස ගිය විට ඒදඬු බඳින්නේ කුමටද?

16
පාඩම
षोढषः पाठः ।

किमर्थं किञ्चिन्न पठसि ?

(ඇයි කිසිවක් පාඩම් නොකරන්නෙ ?)

वाक्य निर्माण परिचयः । २

यदा - तदा (යම් විටක / එවිට)

උදා :- यदा त्वं वदसि तदा अहं न लिखामि ।
यदा अहं वदामि तदा त्वं न वद ।

යම් විටක ඔබ කියහි ද එවිට මම නො ලියමි.
යම් විටක මම කියමි ද එවිට නුඹ නො කියව.

අභ්‍යාසය 16.1

1. **यदा - तदा** ප්‍රයෝගය යොදා පහත වාක්‍ය නැවත ලියන්න.
2. ඒවා සිංහලයට ද නගන්න.

०१. त्वं तत्र न गच्छसि । अहमपि न गच्छामि ।

०२. माता ओदनं पचति । स्वसा दूरदर्शनं पश्यति ।

०३. आचार्यः वर्गं प्रविशति । छात्राः आसनेभ्यः उत्तिष्ठन्ति ।

०४. सूर्यः अस्तं याति । सर्वत्र तिमिरं प्रसरति ।

०५. जननी नास्ति । मधुरान्नं न स्यात् ।

०६. सर्वयानं समये नागच्छति । द्विचक्रेण नगरं गच्छावः ।

०७. चन्द्रं प्रकाश्यते । कुमुदानि विकसन्ति ।

०८. सम्यग् न पठेत् । परीक्षणात् न उत्तरिष्यसि ।

०९. दानं ददाति । स्वर्गं प्रयाति ।

१०. द्वारं उद्घाटयति । अन्तरागच्छामि ।

3. **यदा - तदा** ප්‍රයෝගය යොදා වාක්‍ය 05ක් නිර්මාණය කරන්න.

यद्यपि - तथापि (නමුත්)

උදා :- **यद्यपि धर्मं न सरलं तथापि नित्यमेव श्रवणीयम्।**

ඉදින් ධර්මය සරල නැති නමුත් නිතර ම ඇසිය යුතු ය.

අභ්‍යාසය 16.2

1. පහත සඳහන් වාක්‍ය අධ්‍යයනය කරමින් ඒවා සිංහලයට නගන්න.

०१. यद्यपि स दरिद्रः तथापि स सुखी।

०२. यद्यपि स पण्डितः तथापि संस्कृतं न वदति।

०३. यद्यपि सा रमणीया तथापि दरिद्रा भवति।

०४. यद्यपि ते प्रयत्नं कुर्वन्ति तथापि सा दिवङ्गता।

०५. यद्यपि औषधं तिक्तं तथापि स्वस्थताय योग्यं भवति।

यदि - तर्हि (ඉදින් - එසේ නම්)

උදා :- **यदि धनम् अस्ति तर्हि दानं देहि।**

ඉදින් සල්ලි ඇතිනම්, දන් දෙන්න.

අභ්‍යාසය 16.3

1. පහත වාක්‍ය අධ්‍යයනය කරමින් ඒවා සිංහලයට නගන්න.

०१. यदि पापं न कृतं तर्हि परितापं मा कुरु।

०२. यदि अभाग्यः भवति तर्हि हस्तगतोऽपि निधिः लुप्यति।

०३. यदि सम्यग् पठति तर्हि परीक्षणविषये भयं मा कुरु।

०४. यदि शिशुं उच्चैः रोदिति तर्हि क्षीरं दत्वा लालय।

०५. यदि असत्यमेव वदति तर्हि शतं दण्डय।

०६. यदि विपत्तिः स्यात् तर्हि भेदनं न योग्यम्।

यथा - तथा (යම් සේ ද එසේ)

උදා :- **यथा पिता तथा पुत्रः।**
තාත්තා යම් සේ ද පුතා එසේ ය.

අභ්‍යාසය 16.4

1. පහත වාක්‍ය අධ්‍යයනය කර, ඒවා සිංහලයට නගන්න.

०१. यथा बीजं तथाङ्कुरः।

०२. यथा पूर्वं तथा परम्।

०३. यथा वृक्षः तथा फलम्

०४. यथेच्छसि तथा कुरु।

०५. यथा अयं मम बन्धुः तथा त्वम् अपि।

०६. यथा गुरुः कथयति तथा शिष्यः करोति।

०७. यथा मतिः तथा गतिः।

०८. यथा दृष्टिः तथा सृष्टिः।

2. පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නගන්න.

1. නැටුම යම් සේ ද ගායනය ද එසේ ය.
2. පාපයේ තරමට ම දඬුවම ද වේ.
3. කථාව යම් සේ ද වැඩ ද එසේ ය.
4. ඔබ කෙරෙහි ප්‍රේමය යම් සේ ද ඇය කෙරෙහි එසේ නොවේ.
5. මේ අඹ යම් සේ මිහිරි ද අර අඹ එසේ නොවේ.
6. මේ මල් යම් සේ මනරම් ද අර මල් එසේ ම සුවඳවත් ය.
7. යම් සේ ඔබ කැමති ද එසේ කථා කරන්න.
8. යම් සේ ඔබේ අම්මා උයයි ද එසේ ඔබට ද කරන්නට හැකි ය.

यावत् - तावत् (යම් තාක් - ඒතාක්)

උදා :- **सः यावत् इच्छति तावत् देहि ।**
ඔහු යම්තාක් කැමැති ද ඒතාක් දෙන්න.

අභ්‍යාසය 16.5

1. පහත වාක්‍ය අධ්‍යයනය කර, ඒවා සිංහලයට නගන්න.

०१. त्वं यावत् इच्छसि तावत् गृहाण ।

०२. यावत् दत्तं तावत् भुक्तम् ।

०३. यावत् मम देहे प्राणाः तावत् त्वां न विस्मरिष्यामि ।

०४. यावत् श्वासाः तावत् आशाः ।

०५. तावच्च शोभते मूर्खो यावत् किञ्चिन्न भाषते ।

चेत् (ඉදින්/ එසේ නම්)

උදා :- **गन्तुम् इच्छसि चेत् गच्छ ।**
යන්න කැමති (ඕන) නම්, ඉදින් යන්න

අභ්‍යාසය 16.6

1. පහත වාක්‍ය අධ්‍යයනය කර, ඒවා සිංහලයට නගන්න.

०१. गच्छ गच्छसि चेत् कान्त !

०२. पठितुं न इच्छसि चेत् गृहं गच्छ ।

०३. धनम् इच्छसि चेत् आश्रमं त्यक्त्वा अन्यत्र गच्छ ।

०४. अध्यात्मजीवनम् इच्छसि चेत् अन्यत्र न गत्वा आश्रमे तिष्ठ ।

०५. स्नेहम् इच्छति चेत् प्रवासं न गमनीयम् ।

०६. उपनेत्रं नास्ति चेत् कथं द्रष्टुं शक्नोसि किल ?

नो चेत् (එහෙම නැත්නම්)

උදා :- तूष्णीं तिष्ठ नो चेत् ताडयिष्यामि।

නිහඬ ව සිටින්න. එහෙම නැත්නම් තළන්නෙමි.

අභ්‍යාසය 16.7

- පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නගන්න.

1. මගේ පොත දෙන්න, එසේ නැත්නම් තාත්තට දන්වන්නෙමි.
2. මගේ අණ පිළිපදින්න, එසේ නැත්නම් දඬුවම් ලබන්නෙහි.
3. ධර්මයෙහි හැසිරෙන්න, එසේ නැත්නම් අපායෙහි උපදියි.
4. උදේ ම නැගිටින්න, නැත්නම් පාසල් යන්න පරක්කු වෙයි.
5. හොඳින් රැකබලාගන්න. නැත්නම් අත්හැර යයි.

පුනරීක්ෂණ

1. පහත උද්ධෘතයන්හි යෙදී ඇති සම්බන්ධවාචී පද අධ්‍යයනය කරන්න.
2. සියලු ම වාක්‍ය සිංහලයට නගන්න.

०१. यथा बुद्धिप्रकाशो भवति तथा कोऽप्युपायोऽनुष्ठीयताम्।

०२. एतांस्तव पुत्रान्मासषट्केन यदि नीतिशास्त्रज्ञान्न करोमि - तदा स्वनाम त्यागं करोमि।

०३. यद्येवमभिमतं तर्हि शिवास्ते पन्थानः सन्तु।

०४. यथा अम्भसा भिद्यते सेतुस्तथा पैशुन्याद्भिद्यते स्नेहः।

०५. तद्यावन्नास्य प्रोच्चारितशब्दस्य दृष्टिगोचरे गच्छामि - तावदन्यतो व्रजामि।

०६. तावदत्रैव प्रतिपालय यावदहमेतच्छब्दस्वरूपं ज्ञात्वागच्छामि।

०७. सत्यमेतत् यत्त्वया जल्पितम्।

०८. यथाहं तथा यूयमप्यर्धचन्द्रभाजिनो भविष्यथ।

०९. यद्भवताभिहितं तदेव मया कर्तव्यम्।

१०. यथा वर्धमानेन सह वियोगः संजातस्तथा सर्वं निवेदितम्।

११. यावदुपविष्ठति तावत्सुवर्णरोमदेहयूथमध्ये युद्धमपश्यत्।

१२. यद्येवं तर्हि कथय दृढबन्धनबद्धा सति तत्र गच्छामि।

१३. अथ सा यावत्प्रत्युत्तरं किमपि न ददौ तावत्स प्रकुपितः।

१४. यथा तौ द्वावपि न ज्ञास्यतः तथा मिथो वियोजयिष्यामि।

१५. यावद्राजपुरुषांस्तं वृक्षमारुह्य तत्कोटरमवलोकयन्ति तावत्कृष्णसर्पः दृष्टवन्तः।

१६. यथा गौर्दुह्यते काले पाल्यते च तथा प्रजा।

१७. यद्येवं तर्हि मदीयमेतद्धनम्।

१८. तद्यावन्न कश्चिद्वक्ति तावच्छीघ्रं गम्यताम्।

१९. यथानन्यसदृशान्विदधासि तथा कुरु।

२०. यथा मम मनोरथं सिद्धिं यान्ति तथानुष्ठीयताम्।

උපකාරක පද

නාමපද		ක්‍රියාපද	
1. **दूरदर्शनम्**	- රූපවාහිනිය	1. **लुप्यति**	- ගිලිහෙයි.
2. **वर्गम्**	- පන්තිය	2. **विलम्बति**	- පරක්කු වෙයි.
3. **तिमिरम्**	- අඳුර	3. **उत्तरति**	- සමත් වෙයි.
4. **समये**	- වෙලාවට		
5. **स्वस्थता**	- නිරෝගීබව		
6. **परितापम्**	- පසුතැවීම		
7. **सृष्टिः**	- පැවැත්ම		
8. **स्वासः**	- හුස්ම		
9. **उपनेत्रम्**	- උපැස්යුවල		
10. **पैशुन्यात्**	- කේළමින්		
11. **अम्भसा**	- ජලයෙන්		

परदुःखे दुःखिता विरला।
පරදුඃඛෙ දුඃඛිතා විරලා
අනුන්ගේ දුකෙහි දුකට පත් වන්නෝ විරල ය.

परोपदेशवेलायां शिष्टाः सर्वे भवन्ति ।
පරෝපදේශවේලායාං ශිෂ්ටාඃ සර්වේ භවන්ති
අනුන්ට උපදෙස් දෙන අවස්ථාවේ සියල්ලෝ ශිෂ්ටයෝ ය.

बलं मूर्खस्य मौनत्वम्।
බලං මූර්ඛස්‍ය මෞනත්වම්
මෝඩයාගේ බලය නිහඬ බවයි.

17
පාඩම
सप्तदशः पाठः।

वाक्यं रसात्मकं काव्यम्।

(රසවත් වැකිය කවියකි.)

साहित्य परिचयः। १

"වාක්‍යං රසාත්මකං කාව්‍යම්" රසය ආත්මගත වූ වාක්‍යය කාව්‍යය වේ. කවියා මෙන් ම කවිය ද නිරායාසයෙන් පහළ වන අතර උපද්දවනු නො හැකි ය. කවියක සුන්දරත්වය ශබ්ද රසය හා අර්ථ රසය මත රැඳේ. කවිත්වය සහජ උරුමයකි. කාව්‍යාදර්ශය රචනා කළ දණ්ඩින් නම් විචාරකයා කවියකු සතු විය යුතු ප්‍රධාන ලක්‍ෂණ 04 ක් පෙන්වා දී ඇත.

01. නිසර්ග හැකියාව	"නෛසර්ගකී ච ප්‍රතිභා
02. ප්‍රතිභාව	ශ්‍රුතඤ්ච බහුනිර්මලම්
03. බහුශ්‍රැතභාවය	අමන්දශ්චාභියොගොඃස්‍යාඃ
04. සතතාභ්‍යාසය	කාරණං කාව්‍යසම්පදඃ" යනු ඒවා ය.

මේ ලක්‍ෂණයන්ගෙන් අනූන කාව්‍යනිර්මාණ රාශියක් සංස්කෘත කාව්‍ය සාහිත්‍යය සතු වේ. ශ්‍රව්‍ය හා දෘශ්‍ය යන ප්‍රධාන කාව්‍ය ප්‍රභේද දෙක අතුරින් මහාකාව්‍ය ශ්‍රව්‍යකාව්‍ය වර්ගයට අයත් වේ. මහාකාව්‍ය, ඛණ්ඩකාව්‍ය හා චම්පූකාව්‍ය ප්‍රධාන පද්‍යකාව්‍ය වර්ගත්‍රය යි. මහාකාව්‍යයක ඇතුළත් විය යුතු ලක්‍ෂණ කාව්‍යාදර්ශය, සාහිත්‍යදර්පණ යනාදි කාව්‍ය විචාර ග්‍රන්ථයන්හි සඳහන් වේ.

1. පරිච්ඡේද සර්ග නමින් හැඳින්වීම
2. කථා නායකයා ධීරෝදාත්ත වීම
3. ශෘංගාර, වීර හා ශාන්ත යන රස අතුරින් එකක් ප්‍රධාන රසය වීම
4. ආශීර්වාදයකින් හෝ නමස්කාරයකින් නැතහොත් වස්තු නිර්දේශයකින් ඇරඹීම
5. ඉතිහාස කථාවක් හෝ උසස් අයෙකුගේ චරිතාපදානයක් කථා ශරීරය වීම
6. සර්ග 08 කට නො අඩු - සර්ග 30 කට නො වැඩි වීම
7. වන, පර්වත, ඍතු, උදය, චන්ද්‍රෝදය, සූර්යෝදය, සන්ධ්‍යා, උයන්කෙළි ආදි වර්ණනා
8. විවාහ, සංයෝග, වියෝග, විහාර, යුද්ධ, ජය, පුත්‍රෝත්පත්තිය

යනු යථොක්ත ග්‍රන්ථයන්හි සාකච්ඡා කර ඇති ප්‍රධාන මහාකාව්‍ය ලක්‍ෂණ කිහිපයකි.

මහාකාව්‍ය පරම්පරාවේ ප්‍රථම කවීන්ද්‍රයාණෝ **මහාකවි භදන්ත අශ්වඝෝෂ** පාදයෝ ය. උන්වහන්සේ මහාකාව්‍ය දෙකක් රචනා කළහ. **බුද්ධචරිත මහාකාව්‍යය** ඉන් පළමුවැන්නයි. එහි සර්ග 13 ක් වේ. බුදුහිමියන්ගේ චරිතාපදානය මෙහි ප්‍රධාන වස්තු විෂය වේ. භදන්තාශ්වඝෝෂ මාහිමියන්ගේ දෙවන මහාකාව්‍යය **සෞන්දරනන්දය යි**. සර්ග 18 කින් සමන්විත එහි ප්‍රධාන කථා නායක - නායිකා දෙපළ **නන්ද කුමරු** හා **ජනපදකල්‍යාණිය** යි. භදන්තාශ්වඝෝෂ හිමියන්ගේ කාව්‍යකරණයෙහි ප්‍රධාන අරමුණ ධර්මසන්නිවේදනය යි. රෝගියකුට මී පැණි තවරා තික්ත ඖෂධ ලබා දෙන්නා සේ, ඉතා ගැඹුරු සියුම් ධර්ම කොටස් කවි රසෙහි තවරා කෙලෙස් රෝගයෙන් පරපීඩිත ජනයාට ලබාදීම උන්වහන්සේගේ මුඛ්‍යාභිලාෂය වී තිබේ.

උපමා යෙදීමෙහි ශූරයකු **(උපමා කාලිදාසස්‍ය)** වන මහාකවි කාලිදාසයන් විසින් **රඝුවංශ මහාකාව්‍යය** හා **කුමාරසම්භව මහාකාව්‍යය** යනුවෙන් මහාකාව්‍ය ග්‍රන්ථ දෙකක් රචනා කරන ලදි. **දිලීප, අජ, දශරථ** හා **රාමාදි** රඝු පරම්පරාවේ රජවරුන් පස්දෙනෙක් පිළිබඳ රඝුවංශ මහාකාව්‍යයෙහි වර්ණනා වේ. සර්ග 19 කින් හා පද්‍ය 1576 කින් යුක්ත මෙය මහාකවි කාලිදාසයන්ගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය මතුවන විශිෂ්ට මහාකාව්‍යයකි. මීට අමතර ව ශිව හා පාර්වතී යන දිව්‍යමය දම්පතීන්ගේ ප්‍රේමවෘත්තාන්තය තේමා කරගත් කාලිදාසයන්ගේ ම කුමාරසම්භව මහාකාව්‍යය, ස්කන්ද හෙවත් **කාර්තිකෝත්පත්තිය** ප්‍රමුඛකොටගත් තොරතුරු රසභාවපූර්ණ ව වර්ණනා කෙරෙන මහාර්ඝ නිර්මාණයකි. මෙහි සර්ග සංඛ්‍යාව 17 කි.

මහාකවි කාලිදාසයන්ට පසුව **භාරවී, මාඝ, භට්ටි, ශ්‍රී හර්ෂදේව** වැනි ප්‍රසිද්ධ කවිවරු විසූහ. ඔවුහු පිළිවෙළින් **කිරාතාර්ජුනීය, ශිශුපාලවධ, රාවණවධ** හා **නෛෂධචරිතය** වැනි මහාකාව්‍ය රචනා කළ හ. මීට අමතර ව, **රත්නාකාර, ශිවාස්වාමි, මංඛ, ධර්මනාථ** වැනි පසුකාලීන මහාකාව්‍ය රචකයෝ ද **හරවිජය, ශ්‍රී කණ්ඨචරිත, පාණ්ඩවපුරාණ** ආදි මහාකාව්‍ය රචනා කළහ. එහෙත් ඒවා මහාකවි කාලිදාස හා භදන්තාශ්වඝෝෂ හිමියන්ගේ නිර්මාණ මෙන් ජනප්‍රිය නොවූහ.

අතිශය ජනප්‍රිය හා ආහ්ලාදකර වූ සංස්කෘත සාහිත්‍යාගත මෙම මහාකාව්‍යය රචනා කලාව අනුව යමින් ලක්දිව පඬිවරු ද මහාකාව්‍යකරණයෙහි යෙදුණහ. **පද්‍යචූඩාමණි** යනු කැකුණවෙල පියරතන හිමියන් විසින් මෑතකාලයෙහි රචනා කරන ලද මහාකාව්‍යය යි.

मणिना भूषितः सर्पः किमसौ न भयङ्करः।

මණිනා භූෂිතඃ සර්පඃ කිමසෞ න භයඞ්කරඃ

මැණිකෙන් අලඞ්කාර වුවත් සර්පයා බියකරු නොවේ ද?

मन एव मनुष्याणां कारणं बन्धमोक्षयोः।

මන ඒව මනුෂ්‍යාණාං කාරණං බන්ධමෝක්ෂයෝඃ

මිනිසුන්ගේ බැඳීමට හෝ මිදීමට හේතුව සිතම ය.

मनस्येकं वचस्येकं कर्मण्येकं महात्मनाम्।

මනස්‍යෙකං වචස්‍යෙකං කර්මණ්‍යෙකං මහාත්මනාම්

උතුමන්ගේ සිතේ, වචනයේ හා ක්‍රියාවේ ඇත්තේ එක ම කරුණකි.

18
පාඩම
अष्टदशः पाठः।

अव्यापारे व्यापारं मा कुरु।

(අයිති නැති වැඩ කරන්න එපා)

साहित्य परिचयः। २

සෑම කලාංගයකින් ම සුපෝෂිත සංස්කෘත සාහිත්‍යය තුළ උපදේශ කථා කලාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. කථා හෝ කතන්දර ඔස්සේ උපදේශ ලබාදීම ලොව විකසිත වූ සෑම සාහිත්‍යයක ම දක්නට ලැබෙන ජනප්‍රිය සාහිත්‍ය අංගයක් වේ. සංස්කෘත සාහිත්‍යය ඒ අතර ප්‍රමුඛ වේ. **පඤ්චතන්ත්‍ර** හා **හිතෝපදේශ** යනු එම සාහිත්‍යයෙහි හමුවන චිරප්‍රසිද්ධ උපදේශ ග්‍රන්ථද්වය යි.

විෂ්ණුශර්මන් පඬිවරයා පඤ්චතන්ත්‍රයෙහි කතුවරයා යි. ක්‍රි:ව: 476-579 අතර කාලයෙහි මේ ග්‍රන්ථය රචනා වී ඇත. '**පඤ්ච**' යනු පහ යි. '**තන්ත්‍ර**' යනු **කොටස, පරිච්ඡේදය** හා **පාලනය** යනාර්ථ ලබාදෙන පදයකි. රජදරුවන්ට රාජ්‍යපාලනයට අදාළ නීති ඉගැන්වීම මේ කෘතිය රචනා කිරීමෙහි ප්‍රධාන අරමුණ වේ.

01. මිත්‍රභේද
02. මිත්‍රසම්ප්‍රාප්ති
03. කාකෝලූකීය
04. ලබ්ධප්‍රණාශ
05. අපරීක්ෂිතකාරක යනු එම තන්ත්‍ර පහ යි.

මහිලාරෝප්‍ය නුවර **අමරශක්ති** නම් රජුට **බහුශක්ති, උග්‍රශක්ති** හා **අනන්තශක්ති** යනුවෙන් නූගත් දරුවෝ තිදෙනෙක් සිටියහ. ඔවුන් ධර්මශාස්ත්‍ර හා නීතිශාස්ත්‍ර නිපුණයන් බවට පත්කරලීමේ වගකීම භාර ගන්නා ලද්දේ විෂ්ණුශර්මන් පඬිවරයා විසිනි. මාස හයකින් ඔවුනට නීතිය ඉගැන්වීම සඳහා කතන්දර ස්වරූපයෙන් පඤ්චතන්ත්‍රය ඔහු විසින් රචනා කරන ලදි. මින් පළමු තන්ත්‍ර දෙක **මිතුරන් කෙටවීම** හා **මිතුරන්ගේ අගේ** නමින් **අතිපූජ්‍ය යක්කඩුවේ ප්‍රඥාරාම යතීශ්වරයන්** විසින් සිංහලයෙන් රචනා කරන ලදි.

පිංගලක නම් සිංහයා හා **සංජීවක** නම් වෘෂභයා අතර ඇති වූ හිතවත්කම, **කරටක** හා **දමනක** යන කපටි සිවලුන් දෙදෙනා විසින් විනාශ කර දැමීම මිත්‍රභේදයෙහි ප්‍රධාන කථාව වේ.

"වර්ධමානෝ මහාංස්නේහඃ - සිංහගෝවෘෂයෝර්වනේ
පිශුනේනාතිලුබ්ධේන - ජම්බුකේන විනාශිතඃ "

යනු මිත්‍රභේදයෙහි පළමු ශ්ලෝකය යි. ප්‍රධාන කථාවට අවස්ථාවෝචිත පරිදි අතුරු කථා එකතු කරමින් එය රසවත් කිරීම පඤ්චතන්ත්‍ර කථා කලාවේ ලක්‍ෂණය වී ඇත. මිත්‍රභේදයෙහි ප්‍රධාන කථාවට අමතර ව අතුරු කථා 22ක් දක්නට ලැබේ. ඒ අතර **කීලෝත්පාටී වානර කථා, දන්තිල-ගෝරම්භ කථා, බක-කර්කට කථා, සිංහ-ශශක කථා, කාෂ්ඨභ්‍රෂ්ට කච්ඡප කථා, නෘප සේවක වානර කථා** ආදිය අපේ සමාජයෙහි අතිශයින් ජනප්‍රිය වූ කතන්දර වේ. මේ සෑම කථාවකින් ම උපදේශයක් ලබාදීම වැදගත් ලක්‍ෂණයක් වේ.

පඤ්චතන්ත්‍රය ගද්‍ය හා පද්‍ය මිශ්‍ර භාෂාවෙන් රචනා වී තිබේ. ගද්‍යයෙන් කථාව පවසන අතර පද්‍යයෙන් උපදෙස් ලබා දේ. තන්ත්‍ර පහ පුරා ම සජීවී භාෂා ශෛලියක් හමු වේ. ඒ සංවාද ස්වරූපයෙන් සරල බස් වහරක් යොදා ගෙන තිබීම නිසා ය. මෙහි සඳහන් බොහෝමයක් උපදේශ නීති වශයෙන් හැඳින්වේ. ඒවා **මහාභාරතය, මනුස්මෘතිය** වැනි ග්‍රන්ථයන්ගෙන් උපුටා ගෙන ඇත.

"යස්‍ය බුද්ධිර්බලං තස්‍ය - නිර්බුද්ධෙස්තු කුතෝ බලම්
වනේ සිංහෝ මදෝන්මත්තඃ - ශශකේන නිපාතිතඃ"

"යමකුට ප්‍රඥාව වෙයි ද ඔහුට ශක්තිය වෙයි. මෝඩයාට බලයක් කොයින් ද? කැලයෙහි මදයෙන් උමතු වූ සිංහයා සාවකු විසින් සිය නුවණේ බලයෙන් නසන ලදි. "

යනාදි වශයෙන් කථාවට අදාළ ප්‍රධන උපදේශය මෙන් ම කථාවෙහි ප්‍රධාන චරිත කථාරම්භයේ දී දැක්වීම ද පඤ්චතන්ත්‍රයෙහි පොදු ලක්‍ෂණයකි.

භද්‍ර ! කිමාවයෝරනේන ව්‍යාපාරෙණ ?
අථ භවාන් කිං කර්තුමනාඃ ?
කථමහං සේවානභිඥඃ ?
යද්‍යෙවම් අභිමතං තර්හි ශිවාස්තේ පන්ථානඃ සන්තු.
යථාභිලෂිතමනුෂ්ඨීයතාම්.
අපි ශිවං භවතඃ
කස්මාච්චිරාද්දෘෂ්ටෝ 'සි.
භද්‍ර ! යද්‍යෙවං තත්‍ර ගච්ඡ.
අහෝ විනෂ්ටො'ස්මි.
කිං තත්‍ර භවාන්ගන්තුමුත්සහතේ ?
න ශෝභනං කෘතං මයා.

යනාදි වශයෙන් සංස්කෘත භාෂණය ඉගෙනීමට පඤ්චතන්ත්‍රයෙන් ලැබෙන ආලෝකය සුළුපටු නොවේ. ඒ තුළ හමුවන්නේ සංස්කෘත භාෂාවේ සජීවී බස්වහර යි.

හිත + උපදේශ = හිතෝපදේශය යනු යහපත් වූ උපදෙස් අන්තර්ගත රසවත් කෘතියකි. හිතෝපදේශය **නාරායණශර්මන්** නම් බ්‍රාහ්මණයා විසින් රචනා කර ඇත. පඤ්චතන්ත්‍රයෙන් හා අවශේෂ ග්‍රන්ථයන්ගෙන් කොටස් උපුටා ගෙන මේ කෘතිය රචනා කරන ලද බව එහි ප්‍රස්තාවනාවෙහි එන **''පඤ්චතන්ත්‍රාත් තථාන්‍යස්මාද්ග්‍රන්ථාදාකෘෂ්‍ය ලිඛ්‍යතේ''** යන පාඨයෙන් පැහැදිලි වේ. **සුදර්ශන** නම් රජකෙනකුගේ පුත්‍රයන්ට නීති ශාස්ත්‍රය හා සමාජ ව්‍යවහාරය ඉගැන්වීම උදෙසා මේ ග්‍රන්ථය රචනා කර ඇත. මේ නිසා හිතෝපදේශය, පඤ්චතන්ත්‍රයට පසු ව රචනා කර ඇතැයි කිව හැකි ය. හිතෝපදේශයෙහි සැකැස්ම පඤ්චතන්ත්‍රයෙහි වින්‍යාසය ම වේ. සරල භාෂා ශෛලියක් දක්නට ලැබෙන, මෙහි ප්‍රධාන කොටස් හතරක් වේ.

01. මිත්‍රලාභ
02. සුහෘද්භේද
03. විග්‍රහ
04. සන්ධි යනු ඒවා ය. අතුරු කථා සියල්ල 38 ක් වේ. පද්‍ය ගණනින් 759 කි.

''ශ්‍රැතෝ හිතෝපදේශෝ'යං පාටවං සංස්කෘතෝක්තිෂු
වාචාං සර්වත්‍ර වෛචිත්‍ර්‍යං නීතිවිද්‍යාං දදාති ච''

යනාදි පරිදි හිතෝපදේශය හැදෑරීමෙන් ලැබෙන ප්‍රතිඵල කර්තෘවරයා විසින් ම දක්වා ඇත. සංස්කෘත භාෂා හැසිරවීමෙහි දක්‍ෂභාවය ද විසිතුරු, මනරම් වචන වර්ධනය වීම ද නීතිවිද්‍යා දැනුම ද හිතෝපදේශය හැදෑරීමෙන් ලැබෙන මහඟු ප්‍රතිඵල යි. එමෙන් ම සාර්වකාලීන අගයකින් හා වටිනාකමකින් පරිපූර්ණ උපදේශාවලිය ග්‍රන්ථ සියගණනකින්වත් ලබාගත නොහැකි තරම් ය.

''විද්‍යා දදාති විනයං විනයාද්යාති පාත්‍රතාම්
පාත්‍රත්වාද්ධනමාප්නෝති ධනාද්ධර්මං තතඃ සුඛම්''

පහත පද්‍යය බඳු චිරප්‍රසිද්ධ ශ්ලෝක අන්තර්ගත වනුයේ ද හිතෝපදේශයෙහි ය. ''**පින්මද පුතුන් සියයක් ලදුවත් නිසරු**'' යනාදි පරිදි **අලගියවන්න මුකවෙටිතුමන්** සුභාෂිතයෙහි ජනප්‍රිය කවිය සකස් කර ගෙන ඇත්තේ ද,

''වරමේකෝ ගුණීපුත්‍රෝ න ච මූර්ඛශතාන්‍යපි
ඒකශ්චන්ද්‍රස්තමෝ හන්ති න ච තාරාගණෛරපි''

යන සංස්කෘත සාහිත්‍යාගත උපදේශාත්මක ප්‍රකාශනයන් පදනම් කරගනිමිනි. එබඳු අවස්ථා ගණනාවක් ම සිංහල සාහිත්‍යයෙහි දක්නට ලැබේ.

මේ අයුරින් බලන කල්හි සංස්කෘත උපදේශ සාහිත්‍යය විපතින් මිදී සැපතට පත්වීමට හා අඥාන බවෙන් ඈත් ව ඥානවන්ත බවට පත්වීමට මෙන් ම මානව ශිෂ්ටාචාරයේ නිරාකුල, නිරාබාධ, සුබනම්‍ය ප්‍රවර්තනයට උපකාරී වන සදුපදේශ සම්ප්‍රදානය කරනු ලබන උත්තුංග කාව්‍යාංගයක් බැව් පෙනී යයි.

ලක්දිව බිහිවූ පළමු මහාකාව්‍යය

මෙරට බිහිවූ පළමු මහාකාව්‍යය වන්නේ ජානකීහරණය යි. ලක්දිව රජ කළ කුමාරදාස නම් රජකෙනෙකුන් විසින් රචනා කොට ඇති මෙය සර්ග 20කින් සමන්විත මහා කාව්‍යයකි. මහාවංශයෙහි සඳහන් '**කුමාර ධාතුසේන**' රජු මෙලෙස '**කුමාරදාස**' නමින් හැඳින්වෙන බව විචාරකයන්ගේ මතය යි. එනම් පළමුවැනි මුගලන් රජුගේ පුත්‍රයා ලෙස **ක්‍රිඃවඃ 513 - 522** රජ කළ ධාතුසේන රජු ය. එහෙත් මහාවංශයේ නම් මොහු විසින් ජානකීහරණය රචනා කරන ලද බවක් සඳහන් නොවේ. **පැරකුම්බා සිරිත** නම් කාව්‍යයට අනුව මෙතුමා ජානකීහරණය කළ බවත්, වෙහෙර විහාර ඉදි කළ බවත්, කාලිදාසයන් වෙනුවෙන් දිවි පිදූ බවත් සඳහන් වේ.

වෙහෙරෙ දසටත් පුරා කරවා දස අටක් මහ වැව් බැඳී
වසර එදකා බිසව් අබිසෙස් මහනුවම් තෙමගුල් යෙදී
ඇජර කවියර පිණින් ජානකිහරණ ඈ මහ කව් බැඳී
කුමරදස් රජ කාලිදස් නම් කිවිඳුහට සිය දිවි පිදී

සෙසු බොහෝ කවීන් මෙන් කුමාරදාස කවියා විසින් ද තම සාහිත්‍ය කටයුත්ත සඳහා වස්තුබීජය තෝරා ගන්නා ලද්දේ **රාමායණයෙනි**. එනම් රාම-සීතා කථා පුවත හා රාවණ විසින් සීතා පැහැර ගෙන යාමට අදාළ ප්‍රවෘත්තිය යි. එහෙත් කවියාගේ නිසඟ කිවිත්වය බොහෝ තන්හි ප්‍රකට ව දැක ගත හැකිය.

පළමු සර්ගයෙන් දශරථ රජුගේ ඉතිහාස කථාව විස්තර වේ. රාවණ විසින් පරදවනු ලැබූ ඉන්‍ද්‍ර ඇතුළු දෙවියන් පාතාල ලෝකයේ විසූ **විෂ්ණු** කරා ගොස් ඔහු ලවා මිනිස් ලොව ඉපදීමට පොරොන්දු කරවා ගැනීම දැක්වෙන්නේ දෙවැනි සර්ගයෙහි ය. තෙවැනි සර්ගයෙන් ඍතු වර්ණනාත් සිව්වැන්නෙන් අග්නි පූජා, රාම කුමරුගේ උපත ආදියත් පස්වැන්නෙන් රාම වශිෂ්ඨ සමග වනවාසයට යාමත් හයවැන්නෙන් රාම වනය අතහැර මිථිලාවට යාමත් හත්වැන්නෙන් රාම කුමරු ජනක රජුගේ දියණිය වූ සීතා සමග විවාහ වීමත් අටවැන්නෙන් රාම-සීතාගේ මධුසමයත් නවවැන්නෙන් නව යුවල දශරථ රජු සමග අයෝධ්‍යාවට යාමත් දසවැන්නෙන් දශරථ දුර්වල වීම හා රාවණ විසින් සීතාව පැහැර ගෙන යාමත් විස්තර වේ.

එකොළොස්වැන්නෙන් රාවණ හා ගරුඬ අතර සටනින් රාවණ දිනා සීතාව සමග ලක්දිවට පැමිණීමත් දොළොස් වැන්නෙන් සුග්‍රීව රාම හමුවීමට යාමත් තෙළෙස්වැන්නෙන් රාමගේ විලාපයත් තුදුස්වැන්නෙන් දඹදිව සිට ලක්දිවට පාලමක් කර වීමත් පහළොස්වැන්නෙන් රාම විසින් රාවණට ලිපි යැවීමත් සෙසු සර්ගවලින් රාක්ෂසයන්ගේ විනෝද ක්‍රියාවනුත් රාමගේ විජයග්‍රහණයත් ආදි වශයෙන් ජානකීහරණයෙහි තොරතුරු අන්තර්ගත ව පවතී. ජානකීහරණයේ තේමාව හුරු පුරුදු එකක් වුව ද කවියාගේ මනහර වර්ණනා නිසා නැවුම් බවකින් යුතු ව කාව්‍ය රසය විඳ ගැනිමට පාඨකයාට අවකාශය ලැබේ.

मितं च सारं च वचो हि वाग्मिता।

මිතං ච සාරං ච වචෝ හි වාග්මිතා

සීමිත හා සාරවත් වචනය කථිකත්වය යි.

मृत्योः सर्वत्र तुल्यता।

මෘත්‍යොඃ සර්වත්‍ර තුල්‍යතා

මාරයා සියල්ලන්ට සමාන ව සලකයි.

मात्रा समं नास्ति शरीरतोषणम्।

මාත්‍රා සමං නාස්ති ශරීරතෝෂණම්

මව හා සමාන ශරීරය සනසන්නෙක් නැත.